# කැලණිය විශ්වවිද්‍යාලය

# ශ්‍රී ලංකාව

## ශාස්ත්‍රවේදී (සාමාන්‍ය)
## බාහිර උපාධි පාඨමාලාව

# ශිෂ්‍ය අත්පොත

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
කැලණිය විශ්වවිද්‍යාලය
කැලණිය

**www.cdce.kln.ac.lk**

ප්‍රථම මුද්‍රණය - 2022

**මෙහි අන්තර්ගත විභාග නීතිරීති රෙගුලාසි කැලණිය විශ්වවිද්‍යාලය සතු වන අතර දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ ලිඛිත අවසරයකින් තොරව උපුටා ගැනීම, මුද්‍රණය කිරීම සපුරා තහනම් වේ.**

**සංස්කරණය** - **අධ්‍යක්ෂ**
*ආචාර්ය පූජ්‍ය ඩී. ධම්මදස්සි හිමි*

**ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී**
*එස්. මනිවන්නන්*

**සහකාර මූල්‍යාධිකාරී**
*එස්.සී. වික්‍රමනායක*

**සෝදුපත් බැලීම** - **නියෝජ්‍ය අධ්‍යක්ෂ**
*පූජ්‍ය උඩවෙල රේවත හිමි*

**පිටකවරය** - **නියෝජ්‍ය අධ්‍යක්ෂ**
*දර්ශන මාපා සෝමරත්න*

**පරිගණක සංයෝජනය** - *කනිල් සංඛ තරංග*

ප්‍රකාශනය :

*දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය*
*කැලණිය විශ්වවිද්‍යාලය*
*කැලණිය*

# ශිෂ්‍ය අත්පොත

## ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පාඨමාලාව

## දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

## කැලණිය විශ්වවිද්‍යාලය

පණ්ඩිතාචාර්ය රත්මලානේ ධර්මාලෝක මාහිමියන් විසින් 1875 නොවැම්බර් මස පළමුවන දින ආරම්භ කළ පෑලියගොඩ විද්‍යාලංකාර පිරුවනින් 1959 සැප්තැම්බර් මස 17 වන දින විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය නමින් සරසවියක් බිහි වන්නේ දේශීය අධ්‍යාපනය නගා සිටුවීමේ ප්‍රශස්ත සංකල්පයත් නූතන ලෝකයට අවශ්‍ය ශාස්ත්‍ර ගවේෂණයෙහි යෙදෙන ප්‍රාමාණික විද්වතුන් බිහි කිරීමේ උදාර අභිලාෂයත් පෙරදැරි කරගෙන ය. යථෝක්ත විද්‍යාලංකාර පිරුවෙන්හි පරිවේණාධිපති කිරිවත්තුඩුවේ ප්‍රඥාසාර නාහිමියන් විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයේ ප්‍රථම උපකුලපති ස්වාමින් වහන්සේ ලෙස පත් වූහ. කැලණිය විශ්වවිද්‍යාලය මගින් දශක හයකට අධික කාල පරිච්ඡේදයක් තුළ ශබ්ද ශාස්ත්‍රාදියෙහි ප්‍රගමනය උදෙසා කළ විශිෂ්ට මෙහවර නිසා ම එය දෙස් විදෙස් වියතුන්ගේ ඉමහත් සම්භාවනාවට පාත්‍ර වී ඇති සරසවිය බව සඳහන් කළ යුතු ය. සාර්වභෞම පණ්ඩිත රත්මලානේ ධර්මාරාම මාහිමි, පණ්ඩිත ශිරෝමණී ලුණුපොකුනේ ධම්මානන්ද මාහිමි, පණ්ඩිතාචාර්ය කිරිවත්තුඩුවේ ප්‍රඥාසාර නාහිමි, සාර්වභෞම පණ්ඩිත යක්කඩුවේ පඤ්ඤාරාම නාහිමි, පණ්ඩිතාචාර්ය නාත්තණ්ඩියේ පඤ්ඤාකර නාහිමි, ත්‍රිපිටක වාගීශ්වරාචාර්ය වැලමිටියාවේ කුසලධම්ම නාහිමි යන පරිවේණාධිපති වහන්සේලා මෙම ශාස්ත්‍ර නිකේතනයේ අභිවෘද්ධිය පිණිස මහඟු මෙහවරක් ඉටු කළ යතීන්ද්‍රයන් වහන්සේලා අතර ප්‍රධාන වෙති.

1972 අංක 01 දරන ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලය පනත මගින් ශ්‍රී ලංකාවේ සියලු ම විශ්විද්‍යාලය එක ම විශ්වවිද්‍යාලයක් බවට පත් කරනු ලැබුණු අවස්ථාවේ දී 1972 පෙබරවාරි 15 වන දින සිට මෙම විශ්වවිද්‍යාලය **"ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ විද්‍යාලංකාර මණ්ඩපය"**

බවට පත් විය. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාලය පනතින් 1978 දී ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ව්‍යුහය වරක් සංශෝධනය කරනු ලැබුණු අවස්ථාවේ දී යථෝක්ත මණ්ඩපය **"කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව"** ලෙසින් නැවත වරක් ස්වායත්ත විශ්වවිද්‍යාලයක් බවට පත් කරනු ලැබිණ. 1958 පනත අනුව ආරම්භයේ දී ගිහි පැවිදි ශිෂ්‍යයන් පමණක් ඇතුළත් කරගනු ලැබුණු මෙම ආයතනයට, 1966 අංක 20 දරන, ජාතික උසස් අධ්‍යාපන පනත ක්‍රියාත්මක කරනු ලැබීමත් සමග ම ශිෂ්‍යාවන් ද ඇතුළත් කරගත හැකි විය. ආරම්භයේ දී පැලියගොඩ පිරිවෙන් භූමියෙහි ම පිහිටවනු ලැබුණු මෙම විශ්වවිද්‍යාලය ඉඩකඩ මඳ වීම නිසා නොබෝ කලකින් වෙනත් භූමි භාගයකට ගෙන යාමේ අවශ්‍යතාව පෙනෙන්නට විය. ඒ අනුව දැනට විශ්වවිද්‍යාලය පිහිටුවා තිබෙන මෙම භූමි භාගයට 1975 වන විට විශ්වවිද්‍යාලයේ සියලු ම අංශ ගෙන එනු ලැබිණ. මෙම විශ්වවිද්‍යාලය ආරම්භ කරනු ලැබුණු 1959 දී එය ප්‍රාචීන භාෂා ශාස්ත්‍ර, භූගෝල විද්‍යාව, බෞද්ධ අධ්‍යයන හා දර්ශනය, ආර්ථික විද්‍යාව, ගණිතය හා අධ්‍යාපන විද්‍යාව වැනි විෂය කිහිපයකට පමණක් සීමා වුව ද අද එය මානවශාස්ත්‍ර, සමාජීය විද්‍යා, විද්‍යා, වෛද්‍ය විද්‍යා, වාණිජ හා කළමනාකරණ අධ්‍යයන, පරිගණක තාක්ෂණය සහ පශ්චාද් උපාධි අධ්‍යයන වශයෙන් හැඳින්වෙන පීඨ හතකින් සහ අධ්‍යයන අංශ 44 කින් සමන්විත වූ, ඊට අදාළ විෂය සම්භාරයක් පිළිබඳ උපාධි අධ්‍යයන, පශ්චාද් උපාධි අධ්‍යයන හා පර්යේෂණ කාර්යයෙහි නිරත කීර්තිමත් විශ්වවිද්‍යාලයක් බවට පත්ව ඇත.

## කැලණිය විශ්වවිද්‍යාලයීය ගීතය

සිය දෙස කිතු ගොස
උරුමය සුරකින
සියත් සුවඳ විදු කිරණ බෙදා දෙන
සරා සඳකි විදුලකර උදාගිර
කැලණිය සරසවි මාතා..........//

සතර සයුර වී - දැයට නුවණ දෙන
සත් සිළුමිණ වී - ඉසුරු සදාලන
දැයේ ජීව උල්පත වන් නොසිඳෙන
කැලණිය සරසවි මාතා..........//

සුනිසිත සුවියත් පිවිතුරු නැණ ගුණ
යුගයෙන් යුගයට දැයට තිළිණ කර
තරු පිරිවර සහ මුළු ලොව සරසන
කැලණිය සරසවි මාතා.......
විදු අඹරේ බැබලේවා.......

සිය දෙස කිතු ගොස..........//

***පද රචනය***
මහාචාර්ය දර්ශන රත්නායක

**සංගීතය සහ තනු නිර්මාණය**
කලාකීර්ති රෝහණ වීරසිංහ

# පටුන


- උපකුලපති පණිවුඩය 10-12
- අධ්‍යක්ෂ පණිවුඩය 13-15

1. බාහිර උපාධි පාඨමාලා 16-20
   - 1.1 බාහිර උපාධි කටයුතු හා සම්බන්ධ විශ්වවිද්‍යාලයීය බල මණ්ඩලය
   - 1.2 කැලණිය විශ්වවිද්‍යාල නිලධාරීහු
   - 1.3 දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ නිලධාරීහු
   - 1.4 පාඨමාලාවලට අදාළ පීඨවල, අධ්‍යයන අංශය හා දුරකථන අංක

2. පාඨමාලා ඒකක ක්‍රමය 21-23

3. ශාස්ත්‍රවේදී උපාධි විෂයයන් තෝරා ගැනීම 23-27
   - 3.1 ශාස්ත්‍රවේදී උපාධිය සඳහා විෂයයන් තෝරා ගැනීමේ ක්‍රමවේදය
   - 3.2 නිර්දේශිත විෂය කාණ්ඩ
   - 3.3 විෂයයන් සඳහා සිසුන් තෝරා ගන්නා ක්‍රමවේදය
   - 3.4 විෂයයන් තෝරා ගැනීම සඳහා පූර්ව අවශ්‍යතා ඇති විෂයයන්
   - 3.5 විෂයයන් තෝරා ගැනීම සඳහා පූර්ව අවශ්‍යතා නොමැති විෂයයන්
   - 3.6 අනිවාර්යයෙන් ම තෝරාගත යුතු වෘත්තීය අභිමුඛ පාඨමාලා ඒකක
   - 3.7 සේවය පදනම් කරගත් පුහුණු වැඩසටහන
   - 3.8 ශාස්ත්‍රවේදී උපාධි බාහිර පාඨමාලාවට අදාළ සම්භාර ප්‍රමාණය සකස් වන ආකාරය

4. ශාස්ත්‍රවේදී උපාධි බාහිර පාඨමාලා පරීක්ෂණවලට අදාළ නිර්ණායක 28-34
4.1 ශාස්ත්‍රවේදී උපාධියට අදාළ විෂයයන්
4.2 පාඨමාලා ඒකක
4.3 අධ්‍යයන සම්භාර
4.4 ශ්‍රේණි ලකුණු සාමාන්‍යය අගය
4.5 ශ්‍රේණි ලකුණු සාමාන්‍යය ගණනය කිරීම
4.6 ලකුණු පරාසය හා ශ්‍රේණිගත අගය
4.7. උපාධි සාමාර්ථ්‍යය

5. ලියාපදිංචිය 35-40
5.1. ලියාපදිංචි වීම සඳහා අවශ්‍ය සුදුසුකම්
5.2 ලියාපදිංචි අංකය

6. විභාග පටිපාටිය 41-50
6.1. පරීක්ෂණ සඳහා ප්‍රවේශපත්‍ර
6.2 විභාග පැවැත්වීමේ ක්‍රමවේදය
6.3. ප්‍රතිඵල නිර්ණය කිරීම
6.4 විභාග නීති රීති
6.5. උපාධිය සම්පූර්ණ කිරීම සඳහා ලැබෙන කාලය
6.6 පරීක්ෂණ සඳහා පෙනී සිටීම
6.7 අපේක්ෂකයන්ට උපදෙස්
6.8 විභාග අක්‍රමිකතා

7. විභාග ප්‍රතිඵල නිකුත් කිරීම 50-51
7.1 විභාග ප්‍රතිඵල අත්හිටුවීම/තහනම් කිරීම
7.2 පිළිතුරු පත්‍ර නැවත සමීක්ෂණය කිරීම

8. ගාස්තු 52-53

8.1 පාඨමාලා ගාස්තු

9. අයදුම්පත් කැඳවීම 54

10. අධ්‍යයන කටයුතු සඳහා පහසුකම් සැලසීම 54-56

10.1 අත්පත්‍රිකා/මාර්ගෝපදේශ ග්‍රන්ථ

10.2 උපාධි පරීක්ෂණ සඳහා සම්මන්ත්‍රණ

10.3 ඉගෙනුම් කළමනාකරණ ක්‍රමවේදය (LMS)

10.4 පසුගිය ප්‍රශ්නපත්‍ර

11. සහතිකපත්‍ර නිකුත් කිරීම 56-57

12. වෙනත් කරුණු 57-59

13. බාහිර උපාධි අපේක්ෂකයන්ගේ විශේෂ අවධානය පිණිසයි 60

## උපකුලපති පණිවුඩය

ප්‍රිය සිසු දරුවනි,

ලොව ජනිත වන මානවයන්ගේ සමාජ සංපර්කය හේතු කොටගෙන රැස්කර ගන්නා දැනුම් සම්භාරය එකී දේශයෙහි සෑම අංශයක ම ප්‍රගමනයට හේතු වන බව පැහැදිලි කරුණකි. එකී දැනුම් සම්භාරය මානව සමාජයේ අභිවෘද්ධිය පිණිස මනා කළමනාකරණයකින් භාවිත කිරීමට ඔවුන් සතුව පවතින ප්‍රඥාව මැනවින් ඉවහල් වේ.

එසේ ම එකී දැනුමත් ප්‍රඥාවත් හේතු කොටගෙන ගන්නා තීරණ ලෝකයේ යහ පැවැත්මට හේතු වන්නේ මානවධර්මතා නම් උත්තරීතර ගුණය මුල් කොටගෙන බව ලෝක ඉතිහාසය මධ්‍යස්ථ ව නිරීක්ෂණය කිරීමෙන් මනාව අවබෝධ වේ. දැනුම අවශ්‍ය වන්නේ ප්‍රශ්නයකට පිළිතුරු සැපයීමට ය. පරිපූර්ණ විද්‍යාර්ථියකු බිහි කිරීමට දැනුම පමණක් ප්‍රමාණවත් නොවේ. දෛනික ව මිනිසා මුහුණදෙන ගැටලු රාශියක් ද ඇත. එම ගැටලුවලට ඇත්තේ පිළිතුරු නොවේ. ගැටලුවලට ඇත්තේ විසඳුම් ය. එය දැනුමෙන් පමණක් විසඳාගත නොහැකි ය. එහි දී මහෝපකාරී වන්නේ ප්‍රඥාවයි. එම නිසා දැනුමත් ප්‍රඥාවත් දෙකින් ම සරසවි විද්‍යාර්ථියා පෝෂණය විය යුතු ය. මුලින් සඳහන් කළ පරිදි ම දැනුම හා ප්‍රඥාව මානව ධර්මයන් සමග සංකලනය වීමෙන් අර්ථ සම්පන්න විද්‍යාර්ථියකු බිහිකර ගත හැකි ය. එම නිසා දැනුම කුසලතා හා ආකල්පවලින් පරිපූර්ණ ප්‍රාමාණික විද්‍යාර්ථියකු බිහි කිරීම අපගේ එක ම බලාපොරොත්තුව බව විශේෂයෙන් ම සඳහන් කරමි.

ඔබ අධ්‍යාපනය සඳහා ප්‍රවේශය ලබන කැලණිය විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකාවේ කීර්තිමත් ඉතිහාසයක් තිබෙන විශිෂ්ට අධ්‍යාපන ආයතනයකි. පැලියගොඩ විද්‍යාලංකාර පිරිවෙනින් 1959 දී විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය නමින් ආරම්භ ව පසු ව විද්‍යාලංකාර මණ්ඩපය නමින් ද වර්තමානයෙහි

කැලණිය විශ්වවිද්‍යාලය නමින් ද හඳුන්වන ලබන මෙම සරසවියෙහි ආරම්භය විද්‍යාලංකාර පිරිවෙනේ ආරම්භය දක්වා ඈතට දිව යයි. 1875 නොවැම්බර් 01 වන දින රත්මලානේ ධර්මාලෝක මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින් ආරම්භ කළ පෑලියගොඩ විද්‍යාලංකාර පිරිවෙන 19 වන සියවසෙහි දෙවන අර්ධයෙහි පහළ වූ පෙරදිග අධ්‍යාපනයේ විශිෂ්ට තක්ෂිලාවක් ලෙස පෙර අපර දෙදිග වියතුන්ගේ ඉමහත් සම්භාවනාවට පාත්‍ර වූ විද්‍යා ස්ථානයක් බව සඳහන් කරන්නේ සාඩම්බර හැඟීමෙනි.

1993 වර්ෂයේ කලා සහ වාණිජ පාඨමාලාවලින් පමණක් ආරම්භ වූ කැලණිය විශ්වවිද්‍යාලයේ බාහිර උපාධි පාඨමාලා, 1999 වසර වන විට විද්‍යාවේදී සහ ව්‍යාපාර කළමනාකරණවේදී උපාධි පාඨමාලා සහිත ව පවත්වාගෙන යාමට හැකි වූයේ ශීඝ්‍ර ප්‍රගතියක් ප්‍රදර්ශනය කරමිනි. වර්තමානය වන විට දහස් ගණනක සිසුන්ගේ ප්‍රාර්ථනා ඉටු කෙරෙන අධ්‍යාපන කේන්ද්‍රස්ථානයක් වශයෙන් මෙම ආයතනය පත්ව තිබෙන බව පවසනුයේ හද පිරි සතුටිනි.

බාහිර උපාධි අපේක්ෂකයකු වශයෙන් ආයතනයට බැඳුණ දා සිට උපාධිධාරියකු වශයෙන් සමාජයට අනුයුක්ත කරනු ලබන දින දක්වා අවශ්‍ය සියලු කටයුතු නිරවුල් ව සහ සාර්ථක ව මෙම ආයතනයෙන් සිදුකර ගැනීමේ හැකියාව ලැබීම ඔබ ලද භාග්‍යයකි. විශේෂයෙන් ම සාම්ප්‍රදායික රාමුවෙන් බැහැරව රැකියා වෙළඳපොළ අරමුණු කරගත් පාඨමාලා මගින් උගත්, බුද්ධිමත් පරපුරක් සමාජයට මුදා හැරලීමේ හැකියාව අපට හිමි වූයේ, නව විෂයමාලා හඳුන්වා දෙමින් ඉංග්‍රීසි සහ තොරතුරු තාක්ෂණය වැනි ක්ෂේත්‍රයයන් උපාධි පාඨමාලාවන්ට අන්තර්ගත කරලීමට හැකි වූ නිසා ය. එහි උපරි ම පල නෙළා ගැනීමේ යුතුකම මෙන්ම වගකීම ද ඔබ සතු වන බව මේ අවස්ථාවේ දී සිහිපත් කරමි.

කැලණිය විශ්වවිද්‍යාලයේ දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයෙහි ඔබ ලියාපදිංචි වන්නේ යම් දිනක දී ද එදින සිට ඔබ උපාධිලාභියකු වන දින දක්වා සියලු කටයුතු අන්තර්ජාලය ඔස්සේ සිදු කිරීම ඔබ ලද ජයග්‍රහණයකි. ඒ මගින් ඔබ ආත්ම විශ්වාසයෙන් කටයුතු කරන පුද්ගලයකු වශයෙන් පමණක් නොව, නවීන ලෝකය සමග නව දැනුමෙන් කටයුතු කළ හැකි අයෙකු බවට ද නිරායාසයෙන් ම පත් වෙයි. අභ්‍යන්තර ශිෂ්‍යයකු ලෙස විශ්වවිද්‍යාලයට ඇතුළත් වීමට නොහැකිව ඉච්ඡාභංගත්වයට පත් වූ සිසුන් එකී මානසික තත්ත්වයෙන් දුරස් කරලීමට කැලණිය විශ්වවිද්‍යාලයේ දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය සමත් වූ බව දීර්ඝ කාලයක් පුරාවට අප විසින් බිහි කරනු ලැබූ උපාධිධාරීන් ප්‍රබල සාධකයකි.

බාහිර උපාධි පාඨමාලා සම්බන්ධයෙන් විවේචනාත්මක අදහස් ඉදිරිපත් වන මෙවන් යුගයක, එකී අදහස් නිස්සාර වූවක් බවට පත් කරලීමේ හැකියාව ලැබුණේ කැලණිය විශ්වවිද්‍යාලයේ දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය විසින් නවීන තාක්ෂණය භාවිත කරමින් විද්‍යාර්ථීන්හට ඉගෙනුම් ක්‍රියාවලියට අවශ්‍ය වන පහසුකම් සැලසීම හේතු කොටගෙන ය. මෙම සියලු ක්‍රමවේදයන්වල නිසි ප්‍රයෝජන ලබා ගැනීමේ වගකීම ඔබ සතු වන බව ද අමතක නොකළ යුතු ය.

කැලණිය විශ්වවිද්‍යාලය සතුව පවතින්නා වූ කීර්තිමත් නාමය එලෙසින් ම ආරක්ෂා කරමින් ඔබගේ අධ්‍යාපන කටයුතු සාර්ථක ව ඉටු කරගෙන රටෙහි, ජාතියෙහි හා ශබ්දශාස්ත්‍රාදියෙහි ප්‍රගමනය උදෙසා නිරන්තරයෙන් ම ඔබ කැපවිය යුතු ය. ඒ සඳහා අවශ්‍ය ශක්තිය ධෛර්යය ලැබේවායි ප්‍රාර්ථනා කරමි.

**උපකුලපති**
**කැලණිය විශ්වවිද්‍යාලය**
**කැලණිය**

## අධ්‍යක්ෂ නිවේදනය

**ප්‍රිය විද්‍යාර්ථිනි,**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛන අංක 932/2010, 20/2017 හා 01/2021 අනුව සකස් කරන ලද ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධිය/විද්‍යාවේදී සාමාන්‍ය උපාධිය/ව්‍යාපාර කළමනාකරණවේදී සාමාන්‍ය උපාධිය/වාණිජ විද්‍යාවේදී විශේෂ උපාධිය යන විෂය නිර්දේශයන්ට අනුව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2017 වසරේ දී අත්හිටුවන ලද, ශිෂ්‍ය ලියාපදිංචිය නැවත සිදු කරන ලෙසට දැනුම් දී ඇත. ඒ ක්‍රමවේදයට අනුව 2019 අධ්‍යයන වර්ෂයෙහි සිට කැලණිය විශ්වවිද්‍යාලයේ දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ උපාධි බාහිර පාඨමාලා සඳහා සිසුන් ලියාපදිංචි කරනු ලැබේ.

වසරින් වසර ජාතික විශ්වවිද්‍යාල පද්ධතියෙන් බිහිවන බාහිර උපාධිධාරීන්ගේ සංඛ්‍යාව ඉහළ යෑම නිසා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් විශ්වවිද්‍යාලයවලට අභ්‍යන්තර ව බඳවා ගන්නා ශිෂ්‍ය ප්‍රමාණය මෙන් දෙගුණයක් බඳවා ගැනීමටත් විෂයයන් කිහිපයක් සඳහා විශාල ශිෂ්‍ය සංඛ්‍යාවක් ලියාපදිංචි වීම වළක්වා ලීම සඳහා එක් විෂයකට 25% ක් පමණක් උසස් පෙළ ඉසෙඩ් අගය (z.score) මත බඳවා ගන්නා ලෙසත් ඉහත චක්‍ර ලේඛන හා අංක මගින් දන්වා ඇත. ඒ අනුව සකස් කරන ලද නිර්ණායකයන්ට අනුව ශිෂ්‍ය ලියාපදිංචිය සිදු කරන බව ඔබ විසින් අවබෝධ කරගත යුතු ප්‍රධානතම කාරණයකි.

දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ වෙබ් පිටුව ඔබට පහසුවෙන් පරිහරණය කළ හැකි පරිදි අලුතින් නිර්මාණය කොට ඇති අතර එයට පිවිසීමෙන් ශිෂ්‍ය අත්පොත/ප්‍රවේශ නිර්ණායක/විභාග

නිර්ණායක/ අතිරේක නීතිරීති වැඩි විස්තර සහිත ව බලාගත හැකි ය. එසේ ම වෙබ් පිටුවේ ඇති LMS පිටු/Zoom දේශන/Zoom සම්මන්ත්‍රණ දේශන හා ඉලෙක්ට්‍රොනික් පුස්තකාලය සඳහා ලියාපදිංචියෙන් පසු ඔබට ප්‍රවේශ විය හැකි ය.

දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය ඍජුව ම සිසුන් සමග සම්බන්ධතා පවත්වන ආයතනය වුවත් සියලු විෂය නිර්දේශ, ප්‍රවේශ හා විභාග නිර්ණායක ඇතුලු වෙනත් නීතිරීති, ප්‍රතිපත්ති සකස් කිරීම, ප්‍රශ්න පත්‍ර සකස් කිරීම, උත්තර පත්‍ර බැලීම හා ලකුණු ලේඛන ඇගයීම, විවිධ කාර්යයන් සඳහා ආචාර්යවරුන් පත් කිරීම කැලණිය විශ්වවිද්‍යාලයේ විවිධ මණ්ඩල හා සභාවලින් සිදු වේ. එවා නම් දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ අධ්‍යයන මණ්ඩලය, පීඨ සභා, ප්‍රවේශ කමිටුව, අභියාචනා කමිටුව, විභාග අක්‍රමිකතා කමිටුව, නිල චාරිත්‍ර කමිටුව, විභාග අංශය, ශාස්ත්‍රීය අංශය, දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ කළමනාකරණ කමිටුව, සනාතන සභාව හා පාලක සභාවයි. ඒ අනුව දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය ස්වාධීන අධ්‍යාපන ආයතනයක් නොව කැලණිය විශ්වවිද්‍යාලයේ පරිපාලනයට යටත් වූ ආයතනයක් ලෙසත්, අභ්‍යන්තර උපාධිධාරියෙකු බිහි කරන ආකාරයේ ම මැදිහත් වීමක් බාහිර උපාධිධාරීන් බිහිකරලීම සඳහා විශ්වවිද්‍යාලය මගින් සිදුකරන බවත් ඔබ විසින් තේරුම් ගතයුතු අත්‍යවශ්‍ය ම කාරණයකි. කැලණිය විශ්වවිද්‍යාලයේ දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ බාහිර උපාධිය සඳහා ලියාපදිංචි වී උපාධිය අවසන් කර ගැනීමට නොහැකි වූ අතිවිශාල ශිෂ්‍ය පිරිසක් දැනට සිටින බව ඔබ දන්නා අතර ඔවුනගේ ප්‍රශ්න සාධාරණ ලෙස විසඳීමට දැනටමත් විවිධ ක්‍රියාමාර්ග ගෙන ඇත. පැවැත්වීමට නොහැකි වූ විභාග අඛණ්ඩ ව පැවැත්වීම 2021 දෙසැම්බර් මස සිට ආරම්භ කොට ඇත. පැවැත්වූ සියලු විභාගවල ප්‍රතිඵල නිකුත් කොට ඇත. තව ද නියමිත කාලය ඉක්ම වූ හෝ

අවසාන වසර විභාගවලට පෙනී සිට උපාධිය සම්පූර්ණ කර ගැනීමට නොහැකි වූ විද්‍යාර්ථීන්ට අධ්‍යයන සම්භාර 30ක් සම්පූර්ණ කොට ඇත්නම් මානවශාස්ත්‍ර ඩිප්ලෝමාව/සමාජීයවිද්‍යා ඩිප්ලෝමාව/ වාණිජ විද්‍යාවේදී ඩිප්ලෝමාව/ ව්‍යාපාර කළමනාකරණවේදී ඩිප්ලෝමාව හෝ සම්භාර 60ක් සම්පූර්ණ කොට ඇත්නම්, මානවශාස්ත්‍ර උසස් ඩිප්ලෝමාව/සමාජීයවිද්‍යා උසස් ඩිප්ලෝමාව/ වාණිජ විද්‍යාවේදී උසස් ඩිප්ලෝමාව/ ව්‍යාපාර කළමනාකරණවේදී උසස් ඩිප්ලෝමාව විද්‍යාර්ථීන්ගේ ඉල්ලීම පරිදි ඉදිරියේ දී ලබා දීමට කටයුතු සැලසුම් කොට ඇත.

දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයෙන් මෙතෙක් සිදු වූ අතපසු වීම් සියල්ල මග හරවා ගෙන අභිනව ප්‍රවිෂ්ට ඔබගේ අපේක්ෂාවන් මල්ඵල ගැන්වීමට කටයුතු කිරීම කැලණිය විශ්වවිද්‍යාලයේ උපකුලපතිතුමිය, පීඨාධිපතිවරුන්, අංශාධිපතිවරුන් හා ආචාර්ය මණ්ඩලය ඇතුළු අප සැමගේ ඒකායන බලාපොරොත්තුවයි.

**අධ්‍යක්ෂ**
**දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය**
**කැලණිය විශ්වවිද්‍යාලය**
**කැලණිය**

## 1. බාහිර උපාධි පාඨමාලා ප්‍රවේශය

කැලණිය විශ්වවිද්‍යාලයේ මානවශාස්ත්‍ර, සමාජයීය විද්‍යා, වාණිජ හා කළමනාකරණ අධ්‍යයන සහ විද්‍යා පීඨවලට අදාළ ව බාහිර උපාධි පාඨමාලා ක්‍රියාත්මක වේ. 1993 වර්ෂයේ ශාස්ත්‍රවේදී (සාමාන්‍ය/විශේෂ) සහ වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි පාඨමාලාවන්ගෙන් පමණක් ඇරඹි මෙම ශාස්ත්‍රීය සේවාව 1999 වර්ෂයේ සිට ව්‍යාපාර කළමනාකරණවේදී සාමාන්‍ය සහ විද්‍යාවේදී සාමාන්‍ය උපාධි පාඨමාලා දක්වා ව්‍යාප්ත කිරීමට විශ්වවිද්‍යාලය විසින් කටයුතු යොදන ලදී. ඒ අනුව කැලණිය විශ්වවිද්‍යාලය මගින් පහත සඳහන් බාහිර උපාධි පාඨමාලා හැදෑරීම සඳහා පහසුකම් සලසා ඇත.

**ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධිය**
**විද්‍යාවේදී සාමාන්‍ය (බාහිර) උපාධිය**
**විද්‍යාවේදී වෘත්තීය චිකිත්සාව සාමාන්‍ය (බාහිර) උපාධිය**
**ව්‍යාපාර කළමනාකරණවේදී සාමාන්‍ය (බාහිර) උපාධිය**
**වාණිජ විද්‍යාවේදී විශේෂ (බාහිර) උපාධිය**

උක්ත පාඨමාලා සඳහා අපේක්ෂකයන් ලියාපදිංචි කිරීමේ සිට අදාළ උපාධිය පිරිනැමීම දක්වා වූ සියලු කටයුතු අදාළ විධි විධානවලට යටත්ව පවත්වාගෙන යාම සිදුකරන ලද්දේ කැලණිය විශ්වවිද්‍යාලයේ බාහිර විභාග අංශය විසිනි. එහෙත් 2012 ජනවාරි මස 10 දින දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය ආරම්භ වීමත් සමග එතෙක් බාහිර විභාග අංශය මගින් ඉටුකළ සියලු කාර්යයන් පිළිබඳ සම්පූර්ණ වගකීම දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යයන කේන්ද්‍රය වෙත පවරා දෙනු ලැබී ය.

## 1.1 බාහිර උපාධි කටයුතු හා සම්බන්ධ විශ්වවිද්‍යාලයීය බලමණ්ඩල

බාහිර උපාධි පාඨමාලා සම්බන්ධ සියලු අධ්‍යයන සහ පරිපාලන කටයුතු විශ්වවිද්‍යාල පනතේ විධිවිධානවලට යටත්ව පවත්වා ගෙන යනු ලබන අතර, ඒ සම්බන්ධ ව කටයුතු කිරීමේ සියලු බලතල පහත සඳහන් බලමණ්ඩල වෙත පැවරී ඇත.

**පාලක සභාව**
**සනාතන සභාව**
**දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ කළමනාකරණ කමිටුව**
**ප්‍රවේශ කමිටුව**
**විභාග පරීක්ෂක මණ්ඩල**
**අභියාචනා කමිටුව**
**විභාග අක්‍රමිකතා කමිටුව**
**දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ අධ්‍යයන මණ්ඩලය**
**පීඨ සභා**
**අධ්‍යයන අංශ**

දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයට අදාළ උපාධි කටයුතු සම්බන්ධ සියලු නිර්දේශ අධ්‍යයන අංශ මට්ටමේ සිට ඉහළ මණ්ඩල වෙත ඉදිරිපත් කරනු ලබන අතර, කැලණිය විශ්වවිද්‍යාලයේ සනාතන සභාවේ සහ පාලක සභාවේ අනුමැතිය ලැබීමෙන් පසුව පමණක් එම නිර්දේශ ක්‍රියාත්මක කරනු ලැබේ.

## 1.2 කැලණිය විශ්වවිද්‍යාල නිලධාරීහු

- ❖ කුලපති
- ❖ උපකුලපති
- ❖ පීඨාධිපති - මානවශාස්ත්‍ර පීඨය
- ❖ පීඨාධිපති - වෛද්‍යපීඨය
- ❖ පීඨාධිපති - විද්‍යාපීඨය
- ❖ පීඨාධිපති - වාණිජ හා කළමනාකරණ පීඨය
- ❖ පීඨාධිපති - සමාජීය විද්‍යාපීඨය
- ❖ පීඨාධිපති - පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය
- ❖ පීඨාධිපති - පරිගණක හා තාක්ෂණය පීඨය
- ❖ ලේඛකාධිකාරී
- ❖ පුස්තකාලයාධිකාරී
- ❖ මූල්‍යාධිකාරී

## 1.3 දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ නිලධාරීහු

- ❖ අධ්‍යක්ෂ
- ❖ නියෝජ්‍ය අධ්‍යක්ෂ - ඉගෙනුම් සම්පත්
- ❖ නියෝජ්‍ය අධ්‍යක්ෂ - ලියාපදිංචි හා විභාග
- ❖ නියෝජ්‍ය අධ්‍යක්ෂ - පුහුණු
- ❖ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
- ❖ ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී

## 1.4 පාඨමාලාවලට අදාළ පීඨවල, අධ්‍යයන අංශය හා දුරකථන අංක

### මානවශාස්ත්‍ර පීඨය

| මානවශාස්ත්‍ර පීඨය | සෘජු දුරකථන අංකය | දිගු දුරකථන අංක |
|---|---|---|
| පීඨාධිපති | 0112911913 | 700 |
| පීඨ කාර්යාලය | 0112914484 | 702/703/704/705 |
| සහකාර ලේඛකාධිකාරී | 0112914484 | 701 |
| ඉංග්‍රීසි අධ්‍යයන අංශය | 0112903759 | 759 |
| නූතන භාෂා අධ්‍යයන අංශය | 0112903721 | 721 |
| පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය | 0112903731 | 731 |
| බටහිර සම්භාව්‍ය සංස්කෘතිය හා ක්‍රිස්තියානි සංස්කෘතිය අධ්‍යයන අංශය | 0112903717 | 717 |
| ලලිතකලා අධ්‍යයන අංශය | 0112903772 | 772 |
| වාග්විද්‍යා අධ්‍යයන අංශය | 0112908786 | 671/672 |
| සංස්කෘත හා පෙරදිග ශාස්ත්‍ර අධ්‍යයන අංශය | 0112987101 | 663 |
| සිංහල අධ්‍යයන අංශය | 0112903681 | 681/682 |
| හින්දි අධ්‍යයන අංශය | 0112903775 | 775 |
| ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකය | 0112987102 | 783 |

**සමාජීය විද්‍යාපීඨය**

| සමාජීය විද්‍යාපීඨය | සෘජු දුරකථන අංකය | දිගු දුරකථන අංක |
|---|---|---|
| පීඨාධිපති | 011 2911915 | 800 |
| පීඨ කාර්යාලය | 011 2908168 | 805/808 |
| සහකාර ලේඛකාධිකාරී | 011 2908168 | 801 |
| ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය | 011 2914488 | 827/822 |
| දේශපාලන විද්‍යා අධ්‍යයන අංශය | 011 2903833 | 833 |
| ජාත්‍යන්තර අධ්‍යයනය අධ්‍යයන අංශය | 011 2903830 | 830 |
| සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය | 011 2903820 | 820 |
| ඉතිහාස අධ්‍යයන අංශය | 011 2903841 | 841 |
| ජනසන්නිවේදන අධ්‍යයන අංශය | 011 2903862 | 862 |
| දර්ශන අධ්‍යයන අංශය | 011 2903871 | 871 |
| පුරාවිද්‍යා අධ්‍යයන අංශය | 011 2903891 | 891 |
| පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයන අංශය | 011 2903901 | 901 |
| භූගෝලවිද්‍යා අධ්‍යයන අංශය | 011 2903920 | 920 |
| සමාජවිද්‍යා අධ්‍යයන අංශය | 011 2903939 | 939 |
| ක්‍රීඩා හා විශ්‍රාන්ති කළමනාකරණ අධ්‍යයන අංශය | 011 2903941 | 942/935 |

## 2. පාඨමාලා ඒකක ක්‍රමය

2007 වර්ෂයේ සිට කැලණිය විශ්වවිද්‍යාලයේ සියලු ම බාහිර උපාධි පාඨමාලා අභ්‍යන්තර පාඨමාලා ඒකක ක්‍රමයට සමගාමී ව පවත්වාගෙන යනු ලැබේ. මේ යටතේ සාමාන්‍ය උපාධි පාඨමාලාවක් සම්පූර්ණ කිරීම සඳහා අව ම වශයෙන් අධ්‍යයන සම්භාර 90ක් (Credits) සහ විශේෂ උපාධි පාඨමාලාවක් සම්පූර්ණ කිරීම සඳහා අව ම වශයෙන් අධ්‍යයන සම්භාර 120 ක් (Credits) ද ලබාගත යුතු වේ. කෙසේ නමුත් අදාළ පරීක්ෂණ තවදුරටත් වර්ෂාවසානයේ දී පමණක් පැවැත්වෙන අතර, පාඨමාලා ව්‍යුහයෙහි ඇතිවන වෙනස්කම් පිළිබඳ ව අදාළ අවස්ථාවල දී විද්‍යාර්ථීන් වෙත දන්වනු ඇත. මෙම ක්‍රමය යටතේ ඒ ඒ විෂය ඒකක හැඳින්වීම සඳහා වෙන වෙන ම සංකේත නාමයන් යොදා ඇත. මෙහි දී ඒ ඒ විෂයයන් හැඳින්වීම සඳහා ඉංග්‍රීසි අකුරු හතරක් හා තවත් ඒකක හතරකින් යුතු අංකයක් භාවිත කර ඇත.

උදා:- **SINHALA - SINH 18214**

| Subject | Year | Semester | Subject No | Credit value |
|---|---|---|---|---|
| SINH | 1 | 8 | 21 | 4 |

## මානවශාස්ත්‍ර විෂයයන්

| Code | Subject | විෂයයන් |
|---|---|---|
| BUCU | Buddhist Culture | බෞද්ධසංස්කෘතිය |
| BUPH | Buddhist Philosophy | බෞද්ධදර්ශනය |
| BUPS | Buddhist Psychology | බෞද්ධමනෝවිද්‍යාව |
| CHCU | Christian Culture | ක්‍රිස්තියානි සංස්කෘතිය |
| CHIN | Chinese | චීන |
| DMAT | Drama & Theatre | නාට්‍ය හා රංගකලාව |
| FREN | French | ප්‍රංශ |
| GERM | German | ජර්මන් |
| HIND | Hindi | හින්දි |
| IMAT | Image Arts | ප්‍රතිබිම්බකලා |
| JPNS | Japanese | ජපන් |
| LING | Linguistics | වාග්විද්‍යාව |
| LTCR | Literary Criticism | සාහිත්‍යවිචාරය |
| PADN | Performing Arts (Dance) | ප්‍රාසංගික කලා නර්තතන |
| PALI | Pali | පාලි |
| PAMU | Performing Arts (Music) | ප්‍රාසංගික කලා සංගීතය |
| RUSS | Russian | රුසියන් |
| SANS | Sanskrit | සංස්කෘත |
| SINH | Sinhala | සිංහල |
| VAST | Vasthu Shastra | වාස්තුශාස්ත්‍ර |
| VIAD | Visual Arts | දෘශ්‍යකලා සහ සැලසුම් |
| WCCU | Western Classical Culture | බටහිර සම්භාව්‍ය සංස්කෘතිය |

## සමාජීයවිද්‍යා විෂයයන්

| Code | Subject | විෂයයන් |
|---|---|---|
| ANTH | Anthropology | මානවවිද්‍යාව |
| ARCH | Archaeology | පුරාවිද්‍යාව |
| TCRM | Tourism and Cultural Resource Management | සංචරණය හා සංස්කෘතික සම්පත් කළමනාකරණය |
| INTS | International Studies | ජාත්‍යන්තර අධ්‍යයනය |
| SOST | Social Statistics | සමාජසංඛ්‍යානය |
| ECON | Economics | ආර්ථිකවිද්‍යාව |
| PHIL | Philosophy | දර්ශනය |
| PSYC | Psychology | මනෝවිද්‍යාව |
| POLS | Political Science | දේශපාලනවිද්‍යාව |
| GEOG | Geography | භූගෝලවිද්‍යාව |
| DVST | Development Studies | සංවර්ධන අධ්‍යයනය |
| HIST | History | ඉතිහාසය |
| MACO | Mass Communication | ජනසන්නිවේදනය |
| SOCI | Sociology | සමාජවිද්‍යාව |
| LISC | Library & Information Science | පුස්තකාල හා විඥාපන විද්‍යාව |

## 3. ශාස්ත්‍රවේදී උපාධි විෂයයන් තෝරාගැනීම

### 3.1 ශාස්ත්‍රවේදී උපාධිය සඳහා විෂයයන් තෝරා ගැනීමේ ක්‍රමවේදය

| පළමු කාණ්ඩයෙන් | දෙවන කාණ්ඩයෙන් | තෙවන කාණ්ඩයෙන් | ප්‍රධාන විෂයයන් එකතුව | උපාධිය සඳහා අනිවාර්ය විෂයය ඒකක | අනිවාර්ය සේවය පදනම් කරගත් පුහුණුව |
|---|---|---|---|---|---|
| එක් විෂයයක් පමණක් | විෂයයන් 1ක් හෝ 2ක් හෝ 3ක් | විෂයයන් 1ක් හෝ 2ක් හෝ 3ක් | විෂයයන් 3ක් | ඉංග්‍රීසි විෂයය ඒකක 3ක් හා පරිගණක අධ්‍යයන විෂයය ඒකක 3ක් | පැය 300ක් |

## 3.2 නිර්දේශිත විෂය කාණ්ඩ

| පළමු කාණ්ඩය | දෙවන කාණ්ඩය | තෙවන කාණ්ඩය |
|---|---|---|
| සමාජවිද්‍යාව | ආර්ථිකවිද්‍යාව | බෞද්ධදර්ශනය |
| මනෝවිද්‍යාව | දේශපාලනවිද්‍යාව | බෞද්ධමනෝවිද්‍යාව |
| සිංහල | භූගෝලවිද්‍යාව | පාලි |
| ජනසන්නිවේදනය | පුරාවිද්‍යාව | සංස්කෘත |
| බෞද්ධසංස්කෘතිය | මානවවිද්‍යාව | හින්දි |
| | පුස්තකාල හා විඥාපන විද්‍යාව | ජර්මන් |
| | සංවර්ධන අධ්‍යයනය | රුසියන් |
| | ජාත්‍යන්තර අධ්‍යයනය | චීන |
| | සමාජසංඛ්‍යානය | ප්‍රංශ |
| | සංචාරණය හා සංස්කෘතික සම්පත් කළමනාකරණය | ජපන් |
| | ඉතිහාසය | ක්‍රිස්තියානි සංස්කෘතිය |
| | දර්ශනය | බටහිර සම්භාව්‍ය සංස්කෘතිය |
| | | නාට්‍ය හා රංගකලාව |
| | | ප්‍රතිබිම්බ කලා |
| | | ප්‍රාසංගික කලා සංගීතය |
| | | ප්‍රාසංගික කලා නර්තනය |
| | | දෘශ්‍යකලා හා සැලසුම්කරණය |
| | | වාග්විද්‍යාව |
| | | වාස්තුශාස්ත්‍ර |
| | | සාහිත්‍යවිචාරය |

### 3.3 විෂයයන් සඳහා සිසුන් තෝරා ගන්නා ක්‍රමවේදය

එක් එක් විෂයන්ට විද්‍යාර්ථීන් බඳවා ගත හැකි උපරිම සීමාව අධ්‍යයන වර්ෂයකට අනුමත ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 25%ක් වන බැවින් මේ සඳහා අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) සඳහා ලබා ඇති ඉසෙඩ් අගය (Z-Score) පදනම් කරගෙන එහි ප්‍රමුඛතාව අනුව සිසුන් තෝරා ගැනීම සිදු කරනු ලැබේ.

එසේ ම එක් එක් විෂයයක් පවත්වා ගෙන යෑම සඳහා ලියාපදංචි අවම ශිෂ්‍ය සංඛ්‍යාව 20ක් විය යුතු වේ. තව ද පළමු අවස්ථාවේ දී අපේක්ෂා කළ පරිදි ලියාපදිංචිය ලබා ගැනීමට නොහැකි වුවහොත් ඒ සඳහා නැවත අවස්ථාවන් ලබා දෙනු ලැබේ.

### 3.4 විෂයයන් තෝරා ගැනීම සඳහා පූර්ව අවශ්‍යතා ඇති විෂයයන්

පහත සඳහන් විෂයයන් හැදෑරීමට අපේක්ෂා කරන විද්‍යාර්ථීන්, එම විෂයයන්ට අදාළ ව දක්වා ඇති පූර්ව අවශ්‍යතා සම්පූර්ණ කර තිබිය යුතු ය.

| විෂය | පූර්ව අවශ්‍යතා |
|---|---|
| භූගෝලවිද්‍යාව | අ.පො.ස. (උ. පෙ.) භූගෝල විෂය සමත්වීම |
| ප්‍රාසාංගික කලා නර්තනය | අ.පො.ස. (උ. පෙ.) නර්තනය විෂය සඳහා B සාමාර්ථ්‍යය |
| ප්‍රාසාංගික කලා සංගීතය | අ.පො.ස. (උ. පෙ.) සංගීතය විෂය සඳහා B සාමාර්ථ්‍යය |
| සමාජසංඛ්‍යානය | අ.පො.ස. (සා. පෙ.) ගණිතය විෂය සඳහා C සාමාර්ථ්‍යය |
| ප්‍රංශ/ජපන් | අ.පො.ස. (උ. පෙ.) එම විෂයයන් ගෙන් සමත්වීම හෝ නූතන භාෂා අධ්‍යයන අංශය මගින් පවත්වන යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත්වීම |

### 3.5 විෂයයන් තෝරා ගැනීම සඳහා පූර්ව අවශ්‍යතා නොමැති විෂයයන්

අංක 3.4 යටතේ සඳහන් පූර්ව අවශ්‍යතා ඇති විෂයයන් හැර අංක 3.2 යටතේ ඇති සෑම විෂයය ඒකකයක් ම පූර්ව අවශ්‍යතා නොමැතිව අපේක්ෂකයාගේ රුචිකත්වය මත තෝරා ගැනීමට අවස්ථාව සලසා දී ඇත.

### 3.6 අනිවාර්යයෙන් ම තෝරාගත යුතු වෘත්තීය අභිමුඛ පාඨමාලා ඒකක

| උපාධි මට්ටම | පාඨමාලා ඒකක කේතය | වර්ගය | විෂය ධාරාව |
|---|---|---|---|
| 1 ස්තරය | CBEN 18213 | Compulsory | English for Humanities and Social Sciences |
| 2 ස්තරය | CBEN 28223 | Compulsory | English for Today's World |
| 3 ස්තරය | CBEN 38233 | Compulsory | English for Professional Purposes |

### 3.6.1 තොරතුරු තාක්ෂණය

| උපාධි මට්ටම | පාඨමාලා ඒකක කේතය | වර්ගය | විෂය ධාරාව |
|---|---|---|---|
| 1 ස්තරය | CBIT 18213 | Compulsory | Fundamentals of ICT |
| 2 ස්තරය | CBIT 28223 | Compulsory | MS-Office Applications for Workplace |
| 3 ස්තරය | CBIT 38233 | Compulsory | Cloud Computing in Everyday Life |

### 3.7 සේවය පදනම් කරගත් පුහුණු වැඩසටහන

ලියාපදිංචි සෑම අපේක්ෂකයකු විසින් ම උපාධිය අවසන් වීමට පෙර කැලණිය විශ්වවිද්‍යාලයේ දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය විසින් ලබා දෙන මාර්ගෝපදේශවලට අනුව සේවය පදනම් කරගත් පුහුණු පැය 300ක් සම්පූර්ණ කොට තිබීම උපාධිය සමත්වීම සඳහා අනිවාර්ය වේ.

| උපාධි මට්ටම | පාඨමාලා ඒකක කේතය | වර්ගය | විෂයධාරාව |
|---|---|---|---|
| 3 ස්තරය | CBWT 38213 | Compulsory | Work-based training |

### 3.8 ශාස්ත්‍රවේදී උපාධි බාහිර පාඨමාලාවට අදාළ සම්භාර ප්‍රමාණය සකස් වන ආකාරය

එක් ස්තරයක දී අධ්‍යයන සම්භාර 30 බැගින් ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාවේ ස්තර තුන සඳහා අවම වශයෙන් අධ්‍යයන සම්භාර 90 ක් පහත සඳහන් පරිදි සම්පූර්ණ කළ යුතු වේ. යම් අපේක්ෂකයෙකුට අවශ්‍ය නම් එක් ස්තරයක දී උපරිම වශයෙන් අධ්‍යයන සම්භාර 36 ක් සඳහා ලියාපදිංචි විය හැක.

| උපාධි මට්ටම ස්තරය/ වසර | ප්‍රධාන විෂයන් තුනකි | ප්‍රධාන විෂයයන්හි අධ්‍යයන සම්භාර ප්‍රමාණය | වෘත්තීය අභිමුඛ පාඨමාලා දෙකකි | වෘත්තීය අභිමුඛ පාඨමාලාවන්හි අධ්‍යයන සම්භාර ප්‍රමාණය | වසරක අධ්‍යයන සම්භාර ප්‍රමාණය |
|---|---|---|---|---|---|
| පළමු ස්තරය | 3 | 3×8 =24 | 2 | 2×3 =6 | 30 |
| දෙවන ස්තරය | 3 | 3×8 =24 | 2 | 2×3 =6 | 30 |
| තෙවන ස්තරය | 3 | 3×8 =24 | 2 | 2×3 =6 | 30 |
| වසර තුනට සම්භාර එකතුව | | 72 | | 18 | 90 |

## 4. ශාස්ත්‍රවේදී උපාධි බාහිර පාඨමාලා පරීක්ෂණවලට අදාළ නිර්ණායක

මෙය අධ්‍යයන වර්ෂ තුනක පාඨමාලාවකි. මෙම උපාධි පාඨමාලාවෙහි පළමු, දෙවන හා තෙවන අධ්‍යයන වර්ෂ පිළිවෙළින් පළමු ස්තරය, (Level one) දෙවන ස්තරය (Level two) හා තෙවන ස්තරය (Level three) ලෙස නම් කෙරේ. ශාස්ත්‍රවේදී උපාධිය ප්‍රධාන විෂය තුනක ධාරාව යටතේ සම්පූර්ණ කළ යුතු ය.

### 4.1 ශාස්ත්‍රවේදී උපාධියට අදාළ විෂයයන්

ශාස්ත්‍රවේදී උපාධිය සඳහා මානවශාස්ත්‍ර හා සමාජයීය විද්‍යා පීඨ මගින් ඒකාබද්ධ ව ප්‍රධාන විෂයයන් රාශියක් හඳුන්වා දෙනු ලැබ තිබේ. සෑම ප්‍රධාන විෂයක් ම ඒකකවලට (Units) බෙදා වෙන් කර ඇති හෙයින් ශාස්ත්‍රවේදී උපාධිය, පාඨමාලා ඒකක ක්‍රමය (Course Unit System) මත පදනම් වූ උපාධියක් ලෙස හඳුන්වනු ලැබේ.

### 4.2 පාඨමාලා ඒකක

සෑම ප්‍රධාන විෂයයක් ම ඒකකවලට බෙදා වෙන්කර ඇති අතර එම ඒකක හැදෑරීමට ගතවන කාලය පදනම් කරගෙන අධ්‍යයන සම්භාර (Credit) නමින් වටිනාකමක් ලබා දී තිබේ. ඒ අනුව කිසියම් අධ්‍යයන සම්භාර වටිනාකමක් ඇති විෂය ඒකකයක් පාඨමාලා ඒකකයක් ලෙස හඳුන්වනු ලැබේ. ස්වභාවය අනුව පාඨමාලා ඒකක වර්ග තුනකි. එනම් අනිවාර්ය පාඨමාලා ඒකක (Compulsory course units) වෛකල්පික පාඨමාලා ඒකක (Optional course units) ආධාරක පාඨමාලා ඒකක (Auxiliary cours units) යනුවෙනි. ඒවායේ කෙටි යෙදුම් පිළිවෙලින් **C/O/A** ලෙස විෂය නිර්දේශයන්හි භාවිත වේ.

### 4.3 අධ්‍යයන සම්භාර

අධ්‍යයන සම්භාරයක් යනු අවම වශයෙන් දේශන පැය 15ක් හා ස්වයං අධ්‍යයන පැය 35 ක් හෝ ප්‍රායෝගික පැය 50 ක් හෝ ආයතනික පුහුණු සඳහා නම් පැය 100 ක් ඇගයීම සඳහා භාවිත කෙරෙන මිනුම් ඒකකයකි. කිසියම් ඒකකයක් හැදෑරීමට දේශන පැය 30ක් හා ස්වයං අධ්‍යයන පැය 70 ක කාලයක් ගත වන්නේ නම්, එම පාඨමාලා ඒකකයට අධ්‍යයන සම්භාර (Credit) 2 ක වටිනාකමක් ලැබේ. මෙලෙස ඉගෙනුම් කාලය පදනම් කරගෙන උපාධි පාඨමාලාවේ සියලු ම පාඨමාලා ඒකකවලට ලබා දී තිබෙන වටිනාකම අධ්‍යයන සම්භාර (Credit) නමින් හැඳින්වේ. එක් ස්තරයක දී අධ්‍යයන සම්භාර 30 බැගින් ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාවේ ස්තර තුන සඳහා අවම වශයෙන් අධ්‍යයන සම්භාර 90ක් සම්පූර්ණ කළ යුතු වේ.

### 4.4 ශ්‍රේණි ලකුණු සාමාන්‍යය අගය

ශ්‍රේණි ලකුණු සාමාන්‍යය (GPA) යනු ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාවෙහි සමස්ත අධ්‍යයන කාර්ය සාධනය නිරූපණය කරන තනි සමුච්චිත සංඛ්‍යාවකි. පහත දක්වා ඇති ආකාරයට ගණනය (GPA) කරනු ලැබේ.

පියවර 1

එක් එක් පාඨමාලා ඒකකය සඳහා ලබාගත් ශ්‍රේණියට අදාළ ශ්‍රේණිගත අගය එම ඒකකයෙහි අධ්‍යයන සම්භාර සංඛ්‍යාවෙන් ගුණ කිරීම.

පියවර 2

පියවර 1 හි ලබාගත් සංඛ්‍යා එකට එකතු කිරීම.

**පියවර 3**

පියවර 2 හි ලබාගත් සංඛ්‍යාව පියවර 1 හි සලකන ලද මුළු අධ්‍යයන සම්භාර සංඛ්‍යාවෙන් බෙදනු ලැබීම. උදාහරණ වශයෙන් අධ්‍යයන සම්භාර 4 බැගින් වන පාඨමාලා ඒකක දෙකකුත්, අධ්‍යයන සම්භාර 3 බැගින් වන පාඨමාලා ඒකක එකකුත්, අධ්‍යයන සම්භාර 2 බැගින් වන පාඨමාලා ඒකක එකකුත් සම්පූර්ණ කළ විට ඒ සඳහා පිළිවෙලින් A, B+, B-, C+ යන ශ්‍රේණීන් ලබාගත් විට එම විෂය ඒකක හතරෙහි ශ්‍රේණි ලකුණු සාමාන්‍යය පහත සඳහන් පරිදි ගණනය කරනු ලැබේ.

$$= \frac{4x4.0+4x3.3+3x2.7+2x2.3}{4+4+3+2}$$

$$= \frac{16+13.2+8.1+4.6}{13} = \frac{41.9}{13} = 3.22$$

### 4.5 ශ්‍රේණි ලකුණු සාමාන්‍යය ගණනය කිරීම

ශාස්ත්‍රවේදී උපාධිය සඳහා ශ්‍රේණි ලකුණු සාමාන්‍යය දශමස්ථාන දෙකකට වටයනු ලැබේ. ඒ සඳහා අවම වශයෙන් ඉහළ ම ශ්‍රේණි සහිත අනිවාර්ය පාඨමාලා ඒකකවලට අදාළ අධ්‍යයන සම්භාර 90 සලකනු ලැබේ.

### 4.6 ලකුණු පරාසය හා ශ්‍රේණිගත අගය

පාඨමාලා ඒකකයක් සඳහා ලබා ගන්නා ලකුණුවලට අනුව ලැබෙන ශ්‍රේණිය හා ශ්‍රේණිගත අගය (GPV) පහත දැක් වේ.

| ලකුණු පරාසය | ශ්‍රේණිය | ශ්‍රේණිගත අගය |
| --- | --- | --- |
| 85-100 | A+ | 4.0 |
| 70-84 | A | 4.0 |
| 65-69 | A- | 3.7 |
| 60-64 | B+ | 3.3 |
| 55-59 | B | 3.0 |
| 50-54 | B- | 2.7 |
| 45-49 | C+ | 2.3 |
| 40-44 | C | 2.0 |
| 35-39 | C- | 1.7 |
| 30-34 | D+ | 1.3 |
| 25-29 | D | 1.0 |
| 00-24 | E | 0.0 |

### 4.7. උපාධි සාමාර්ථ්‍යය

(අ). ඒ ඒ උපාධි පාඨමාලාවන් සඳහා නියමිත පරීක්ෂණ සියල්ලෙන් ම අදාළ රෙගුලාසිවලට අනුකූල ව සියලු අවශ්‍යතා සම්පූර්ණ කර ඇති බවට පරීක්ෂණ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන අපේක්ෂකයන් අදාළ උපාධිය සමත් වූ ලෙස සලකනු ලැබේ.

(ආ). උපාධි ප්‍රදානය කිරීම ඒ ඒ පාඨමාලාවට අදාළ නිර්නායකයන්ට අනුකූල ව මෙන් ම සනාතන සභාව විසින් අනුමත කර ඇති අතුරු නීති (BY LAWS) අනුව සිදු වේ.

### 4.7.1 ශාස්ත්‍රවේදී උපාධියට අදාළ නිර්ණායක

එක් ස්තරයක දී අවම වශයෙන් අධ්‍යයන සම්භාර 30 බැගින් ස්තර තුන තුළ අවම වශයෙන් අධ්‍යයන සම්භාර 90 ක් සම්පූර්ණ කර තිබිය යුතු ය.

සෑම ස්තරයක දී ම අවම වශයෙන් අධ්‍යයන සම්භාර 24 කට **C** හෝ ඊට ඉහළ ශ්‍රේණි ලබා තිබිය යුතුයි.

ලියාපදිංචි වී ඇති පාඨමාලා ඒකකවල අධ්‍යයන සම්භාර සියල්ලේ එකතුවෙන් අවම වශයෙන් අනිවාර්ය විෂය ඒකකවල අධ්‍යයන සම්භාර 72 ක් සඳහා **C** හෝ ඊට ඉහළ ශ්‍රේණි ලබා තිබිය යුතුයි.

ප්‍රධාන විෂයයන්හි අනිවාර්ය පාඨමාලා ඒකක තුන සඳහා සම්පූර්ණ කළ යුතු අධ්‍යයන සම්භාර 72 න් අවම වශයෙන් අධ්‍යයන සම්භාර 60ක් සඳහා **C** හෝ ඊට ඉහළ ශ්‍රේණි ලබා තිබිය යුතුයි. ඉතිරි අධ්‍යයන සම්භාර 12 න් විෂයයන් තුන සඳහා අධ්‍යයන සම්භාර 4 බැගින් වන පරිදි අවම වශයෙන් **D** හෝ ඊට ඉහළ ශ්‍රේණි ලබා තිබිය යුතුයි.

වෘත්තිය අභිමුඛ පාඨමාලා ඒකක සඳහා ලබා ගත යුතු අධ්‍යයන සම්භාර 18 න් අවම වශයෙන් අධ්‍යයන සම්භාර 12 ක් සඳහා **C** හෝ ඊට ඉහළ ශ්‍රේණි ලබා තිබිය යුතුයි. ඉතිරි අධ්‍යයන සම්භාර 6 සඳහා අවම වශයෙන් **D** හෝ ඊට ඉහළ ශ්‍රේණි ලබා තිබිය යුතුයි.

අවම ශ්‍රේණි ලකුණු සාමාන්‍යය (GPA) 2.00 ක් විය යුතු ය.

සේවා ස්ථානය පදනම් කරගත් පුහුණු (work-based training) පැය 300 ක් සම්පූර්ණ කර තිබිය යුතුයි.

ලියාපදිංචි කිසිදු පාඨමාලා ඒකකයක් සඳහා **E** ශ්‍රේණි ලබා නොතිබිය යුතුයි.

ඉහත සියලු ම අවශ්‍යතා උපරිම වශයෙන් අඛණ්ඩ අධ්‍යයන වර්ෂ 5 ක් තුළ දී සපුරා තිබිය යුතු ය.

ලියාපදිංචි වී විභාගයට පෙනී නොසිටි **(AB)** පාඨමාලා ඒකක ද **E** ශ්‍රේණි ලෙස සලකනු ලැබේ.

**C** ශ්‍රේණියට පහළ ශ්‍රේණි **C-/D+/D/E** ලබා ගෙන ඇති විෂය ඒකක අසමත් වූ විෂය ඒකක ලෙස සලකනු ලැබේ.

**ප්‍රථම පන්ති සාමාර්ථ්‍යය**

ලියාපදිංචි වී ඇති සියලු ම පාඨමාලා ඒකක සඳහා **C** හෝ ඊට ඉහල ශ්‍රේණි ලබාගත යුතු ය.

ශ්‍රේණි ලකුණු සාමාන්‍යය සඳහා සලකනු ලබන අධ්‍යයන සම්භාර 90 න් අවම වශයෙන් 70% කට අදාළ පාඨමාලා ඒකක සඳහා **A** හෝ ඉහළ ශ්‍රේණි ලබාගත යුතු ය.

අවම ශ්‍රේණි ලකුණු සාමාන්‍යය (GPA) 3.70 ක් විය යුතු ය.

ඉහත සියලු ම අවශ්‍යතා අඛණ්ඩ අධ්‍යයන වර්ෂ 3 ක් තුළ දී සපුරා තිබිය යුතු ය.

**දෙවන පන්ති (ඉහළ) සාමාර්ථ්‍යය**

ලියා පදිංචි වී ඇති සියලු ම පාඨමාලා ඒකක සඳහා C හෝ ඊට ඉහල ශ්‍රේණි ලබාගත යුතු ය.

ශ්‍රේණි ලකුණු සාමාන්‍යය සඳහා සලකනු ලබන අධ්‍යයන සම්භාර 90 න් අවම වශයෙන් 60% කට අදාළ පාඨමාලා ඒකක සඳහා B හෝ ඉහළ ශ්‍රේණි ලබාගත යුතු ය.

අවම ශ්‍රේණි ලකුණු සාමාන්‍යය (GPA) 3.30 ක් විය යුතු ය.

ඉහත සියලු ම අවශ්‍යතා අඛණ්ඩ අධ්‍යයන වර්ෂ 3 ක් තුළ දී සපුරා තිබිය යුතු ය.

**දෙවන පන්ති (පහළ) සාමාර්ථ්‍යය**

ලියා පදිංචි වී ඇති සියලු ම පාඨමාලා ඒකක සඳහා C හෝ ඊට ඉහළ ශ්‍රේණි ලබාගත යුතු ය.

ශ්‍රේණි ලකුණු සාමාන්‍යය සඳහා සලකනු ලබන අධ්‍යයන සම්භාර 90 න් අවම වශයෙන් 60% කට අදාළ පාඨමාලා ඒකක සඳහා B හෝ ඉහළ ශ්‍රේණි ලබාගත යුතු ය.

අවම ශ්‍රේණි ලකුණු සාමාන්‍යය (GPA) 3.00 ක් විය යුතු ය.

ඉහත සියලු ම අවශ්‍යතා අඛණ්ඩ අධ්‍යයන වර්ෂ 3 ක් තුළ දී සපුරා තිබිය යුතු ය.

# 5. ලියාපදිංචිය

## 5.1. ලියාපදිංචි වීම සඳහා අවශ්‍ය සුදුසුකම්

එක් එක් පාඨමාලාව සඳහා ලියාපදිංචි වීමට අවශ්‍ය මූලික සුදුසුකම් පිළිබඳ සියලු විස්තර මතු දැක්වෙන අතර, අදාළ සුදුසුකම් සපුරා නොමැති කිසි ම අපේක්ෂකයකු ලියාපදිංචි වීම සඳහා අයදුම් නොකළ යුතු ය.

### 5.1.1 අ.පො.ස. උසස් පෙළ

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත් වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) පරීක්ෂණයෙන් සමත් විය යුතුය. ඒ ඒ විෂයයන් සඳහා සීමිත ශිෂ්‍ය සංඛ්‍යාවක් පමණක් ලියාපදිංචි කර ගන්නා බැවින් අ.පො.ස. (උ.පෙළ) පරීක්ෂණයේ දී ඉහළ ම z ලකුණු ලබා ඇති අයට ප්‍රමුඛතාව ලබාදීමේ පදනම මත අදාළ අපේක්ෂකයන් තෝරා ගැනීම සිදු කරනු ලැබේ.

### 5.1.2 NVQ

ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශ රාමුවේ දැක්වෙන යෝග්‍යතා මට්ටම් තුන, විශ්වවිද්‍යාල මට්ටම් එක සඳහා අවශ්‍ය ශ්‍රී ලංකා යෝග්‍යතා මට්ටම් දෙකට අදාළ (SLQF Level - 02) සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන්ට (NVQ Level - 5, Advanced Certificate) ලියාපදිංචි වීමට අයදුම් කළ හැකි ය.

වැදගත්

***මෙම විශ්වවිද්‍යාලයේ අධ්‍යයන අංශවලට සම්බන්ධ සේවයේ නියුතු අයෙකු අදාළ පාඨමාලා සඳහා ලියාපදිංචි වීමට අයදුම් කරන අවස්ථාවල දී ඔහු/ඇය සේවය කරන දෙපාර්තමේන්තුවලට සම්බන්ධ විෂයයන් තෝරා නොගන්නා බවට ප්‍රකාශයක් අදාළ අංශප්‍රධානගේ නිර්දේශය ද සහිත ව ඉදිරිපත් කළ යුතු ය.***

### 5.1.3 වෙනත් සුදුසුකම්

අ.පො.ස. (උ.පෙළ) පරීක්ෂණයේ ප්‍රතිඵල මත හැරුණු විට අදාළ වෙනත් පිළිගත් සුදුසුකම් මත ද ඉතා සීමිත ශිෂ්‍ය සංඛ්‍යාවක් ලියාපදිංචි කර ගනු ලැබේ. 2016 අධ්‍යයන වර්ෂයේ සිට ඒ ඒ අධ්‍යයන වර්ෂවලට අදාළ බාහිර විභාග පාඨමාලා සඳහා ප්‍රවේශ කමිටුවේ නිර්දේශ මත සනාතන සභාව අනුමත කළ පහත සඳහන් වෙනත් සුදුසුකම්වලින් ලියාපදිංචි වීමට අයදුම් කළ හැකි ය.

i. විශ්වවිද්‍යාලයීය උසස් සහතික පත්‍ර පාඨමාලාව සමත් වී තිබීම.

ii. ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමිතියේ ප්‍රාචීන මධ්‍යම පරීක්ෂණයෙන් සමත් වී තිබීම.

iii. අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පුහුණු ගුරු සහතික පත්‍රය හෝ අධ්‍යාපන විද්‍යාපීඨ ගුරු ඩිප්ලෝමා සහතිකය.

vi. ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ අවසාන පරීක්ෂණයෙන් සමත් වී තිබීම.

v. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම.

vi. පිරිවැය හා කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ (CIMA) සාමාජිකත්වය ලබා තිබීම.

vii. ශ්‍රී ලංකා යුද්ධ, නාවික හෝ ගුවන් හමුදාවේ ස්ථිර බලකායක අධිකාරිලත් නිලධාරියකු වශයෙන් වසරක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබීම.

viii. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ තුන්වන පන්තියට බඳවා ගැනීමේ සීමිත විභාගයෙන් සමත් වී ශ්‍රී ලංකා පරිපාලන සේවයට බැඳී සිටින නිලධාරියෙකු වීම.

ix. ලන්ඩන් උසස් පෙළ පරීක්ෂණයෙන් සමත් වීම.

විශ්වවිද්‍යාලයීය ප්‍රවේශ කමිටුව හා සනාතන සභාව විසින් මතු අනුමත කරනු ලබන වෙනත් සුදුසුකම් ද ලියාපදිංචිය සඳහා සලකා බලනු ලැබේ.

### 5.1.4 වයස් සීමාව

බාහිර උපාධි සඳහා ලියාපදිංචි වීමට වයස අවු. 18 ට වැඩි අයට පමණක් අයදුම්පත් ඉදිරිපත් කළ හැකි අතර, වයස තහවුරු කිරීම සඳහා උප්පැන්න සහතිකයේ මුල් පිටපතක් ඉල්ලා සිටින ඕනෑ ම අවස්ථාවක දී ඉදිරිපත් කිරීමට සූදානමින් සිටිය යුතු ය.

5.1.2 හා 5.1.3 යටතේ සඳහන් තෝරා ගැනීම් සිදු කරනු ලබන්නේ 5.1.1 යටතේ තෝරා ගැනීම්වලින් පසුව හා විශේෂ අවස්ථාවල දී සීමිත ශිෂ්‍ය සංඛ්‍යාවක් පමණි.

### 5.1.5 ප්‍රවේශය සඳහා යෝජිත ශිෂ්‍ය සංඛ්‍යාව

අධ්‍යයන වර්ෂ සඳහා උපාධි පාඨමාලාවට ඇතුළත් වන මුළු ශිෂ්‍ය සංඛ්‍යාව විශ්වවිද්‍යාලයේ අනුරූප අභ්‍යන්තර වැඩසටහනට ඇතුළත් කර ගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව මෙන් දෙගුණයක් වනු ඇත.

### 5.1.6 ප්‍රවේශය සඳහා සිසුන් තෝරා ගන්නා ක්‍රමවේදය

සෑම අධ්‍යයන වර්ෂයක් සඳහා ම දැනට සහ ඉදිරියට සිසුන් තෝරා ගැනීම පහත සඳහන් ක්‍රමවේදයට අනුව වෙන් වෙන් වශයෙන් සිදු කරනු ලැබේ.

| | |
|---|---|
| I අයදුම්පත් කැඳවන අධ්‍යයන වර්ෂයට අදාළ අ.පො.ස. (උ.පෙ) පදනම මත | 80% |
| II අයදුම්පත් කැඳවන අධ්‍යයන වර්ෂවලට පෙර අ.පො.ස. (උ.පෙ) පදනම මත | 15% |
| III බාහිර විභාග පාඨමාලා සඳහා සනාතන සභාවේ අනුමත වෙනත් සුදුසුකම් මත හා අ.පො.ස. (උ.පෙ) සුදුසුකම් සපුරා ඇති රාජ්‍ය සේවයේ නියුක්තිකයන් සඳහා | 5% |
| II, III කාණ්ඩවල පුරප්පාඩු ඇති වූ විට එම පුරප්පාඩු I කාණ්ඩය යටතේ සම්පූර්ණ කළ යුතු ය. | |
| I කාණ්ඩයේ පුරප්පාඩු ඇති වූ විට එම පුරප්පාඩු II කාණ්ඩය යටතේ සම්පූර්ණ කළ යුතු ය. | |

## 5.2 ලියාපදිංචි අංකය

උපාධි පාඨමාලා සඳහා බාහිර ශිෂ්‍යයකු වශයෙන් ලියාපදිංචි කර ගනු ලබන සෑම ශිෂ්‍යයෙකු වෙත ම ලියාපදිංචි අංකයක් නිකුත් කරනු ලැබේ. කිසියම් අපේක්ෂකයෙකු බාහිර විභාග සම්බන්ධයෙන් කරනු ලබන සෑම විමසීමක දී ම තම ලියාපදිංචි අංකය සඳහන් කිරීම අත්‍යවශ්‍ය වේ.

### 5.2.1 ලියාපදිංචිය තහවුරු කිරීමේ ලිපිය සහ ශිෂ්‍ය හැඳුනුම්පත

ලියාපදිංචි වීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කරන සෑම අයදුම්කරුවෙක් වෙත ම ඔහු/ඇය අදාළ බාහිර උපාධි පාඨමාලාව සඳහා ලියාපදිංචි කර ඇති බව තහවුරු කරන ලිපියක් (අදාළ විස්තර ඇතුළත් කොට) ද සමගින් බාහිර ශිෂ්‍ය හැඳුනුම්පතක් නිකුත් කරනු ලැබේ.

### 5.2.2 ලියාපදිංචියේ වලංගුතාව

ප්‍රථම ලියාපදිංචියෙන් පසුව ද සෑම අධ්‍යයන වර්ෂයක් සඳහා ම නියමිත ගාස්තු ගෙවා තම ලියාපදිංචිය දීර්ඝ කරවා ගැනීමට අපේක්ෂකයන් කටයුතු කළ යුතු වේ. එසේ ලියාපදිංචිය දීර්ඝ කරගත හැකි උපරි ම කාලය උපාධි පාඨමාලාව සම්පූර්ණ කර ගැනීම හෝ මුල් ලියාපදිංචියේ සිට අධ්‍යයන වර්ෂ හතක (07) කාලයක් සම්පූර්ණ වීම යන දෙකින් පළමුව එළඹෙන දිනෙන් අවසන් වේ. අභියාචනා මගින් වසර 10 දක්වා දිර්ඝ කරගත හැකි ය.

### 5.2.3. ලියාපදිංචිය දීර්ඝ කිරීම

සිය ලියාපදිංචි කාලසීමාව ඉකුත්වී ඇති අපේක්ෂකයෙකුට කිසිදු පරීක්ෂණයක් සඳහා පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ. එබැවින් තම ලියාපදිංචි කාලසීමාව ඉකුත්වීමට පෙර අවශ්‍යතාව පරිදි එය දීර්ඝ කරවා ගැනීමට කටයුතු කිරීම අදාළ අපේක්ෂකයාගේ වගකීම වේ. පරීක්‍ෂණ සඳහා අයදුම් කරන අවස්ථාවල දී ලියාපදිංචිය දීර්ඝ කිරීම සම්බන්ධ උපදෙස් ලබාගත හැකි ය. සෑම ලියාපදිංචියක් ම වසරක කාලයට පමණක් වලංගු වේ.

### 5.2.4 ලියාපදිංචිය අවලංගු කිරීම

(අ). ලියාපදිංචි බාහිර උපාධි අපේක්ෂකයෙකුට තම අභිමතය පරිදි ඕනෑ ම අවස්ථාවක දී සිය ලියාපදිංචිය අවලංගු කරවා ගත හැකි ය.

<u>එවැනි අවස්ථාවක දී අදාළ ගාස්තු ආපසු ලබා දෙන ලෙස ඉල්ලීමට අපේක්ෂකයෙකුට අයිතියක් නොමැත.</u>

පරීක්ෂණයක ප්‍රතිඵල අපේක්ෂාවෙන් සිටින හෝ විභාග අක්‍රමිකතාවක් සම්බන්ධයෙන් විනයානුකූල ක්‍රියාමාර්ගයක් ගැනීමට

නියමිතව ඇති අපේක්ෂකයකු විසින් ලියාපදිංචිය අවලංගු කරවා ගැනීම සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

සිය ලියාපදිංචි කාලසීමාව අවසන් වීමට පෙර අවශ්‍යතාව පරිදි එය දීර්ඝ කර ගැනීමට කටයුතු නොකරන අපේක්ෂකයන්ගේ ලියාපදිංචිය ස්වයංක්‍රියව ම අවලංගු වන අතර, එවැනි අයෙකු නැවත ලියාපදිංචි වීමට අපේක්ෂා කරන්නේ නම් ලියාපදිංචි වීමේ පටිපාටියට අනුව නව අයදුම්පත්‍රයක් ඒ සඳහා ඉදිරිපත් කළ යුතු වේ.

### 5.2.5 එක් එක් විෂයයක් සඳහා ලියාපදිංචිය ලබා දෙන උපරිම සීමාව හා අවම සීමාව

අධ්‍යයන වර්ෂයට අනුමත ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 25 % ක උපරිමයකට යටත්ව එක් විෂයක් සඳහා ලියාපදිංචියට ලබා දෙන අතර අවම වශයෙන් අයදුම්කරුවන් 20 දෙනකුවත් නොමැති විෂයන් සඳහා ලියාපදිංචිය සිදු කරනු නොලැබේ. එබැවින් මෙම හේතු නිසා ලියාපදිංචිය ප්‍රතික්ෂේප අයදුම්කරුවන්ට වෙනත් විෂයන් ඉල්ලීම සඳහා අවස්ථාව ලබා දෙනු ලැබේ.

### 5.2.6 ලියාපදිංචි විෂය හෝ භාෂා මාධ්‍ය සංශෝධන කිරීම

ලියාපදිංචි විෂයයන් මාරු කිරීමට හෝ භාෂා මාධ්‍ය වෙනස් කිරීමට සෑම අපේක්ෂකයෙකුට ම එක් අවස්ථාවක් ලැබෙන අතර එය ආයතනයේ ලියාපදිංචිය අවසන් වූ දිනයේ සිට මාසයක් ඇතුළත සිදුකර ගත යුතු වේ. ඉන් පසු කුමන හෝ හේතුවක් මත විෂය හෝ භාෂා මාධ්‍ය වෙනස් කළ නොහැක.

## 6. විභාග පටිපාටිය

කැලණිය විශ්වවිද්‍යාලය මගින් පවත්වාගෙන යනු ලබන සියලුම බාහිර උපාධි පාඨමාලාවන් සඳහා අදාළ පරීක්ෂණ ඒ ඒ අධ්‍යයන වර්ෂ අවසානයේ දී පැවැත්වීමට විධි විධාන යොදා ඇත. මුල් ලියාපදිංචියේ සිට වසරක කාලයක් ගතවීමෙන් පසුව ඒ ඒ පාඨමාලාවන්ට අදාළ ප්‍රථම පරීක්ෂණවලට අපේක්ෂකයන් පෙනී සිටිය යුතු ය. අනතුරුව එළඹෙන වර්ෂවල දී ද්විතීය සහ තෘතීය පරීක්ෂණ සඳහා පිළිවෙළින් පෙනී සිටිය හැකි වේ. එසේ ම අනතුරුව එළඹෙන වර්ෂවල දී පූර්ව වර්ෂවල අසමත්වන හෝ ඌන සාමර්ථ්‍යයන් ලබන විෂයයන් සඳහා නැවත පෙනී සිටීමට ද අපෙක්ෂකයන්ට අවසර දෙනු ලැබේ.

එහෙත් සෑම ලියාපදිංචි අපේක්ෂකයකු විසින් ම එළඹෙන සෑම වර්ෂයක් සඳහා ම නියමිත ගාස්තු ගෙවා තම ලියාපදිංචිය දීර්ඝ කරවා ගැනීමට වග බලා ගත යුතු අතර, එසේ ලියාපදිංචිය දීර්ඝ කරවා ගත හැකි උපරිම කාලය අවසන් වීමට පෙර තම උපාධි පාඨමාලාව අවසන් කර ගැනීමට ද වග බලා ගත යුතු වේ.

### 6.1. පරීක්ෂණ සඳහා ප්‍රවේශපත්‍ර

සෑම පරීක්ෂණයක් ම ආරම්භ වීමට අවම වශයෙන් සති දෙකකට පෙර, අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර ඇති සියලු අපේක්ෂකයන් වෙත පරීක්ෂණය සඳහා අදාළ ප්‍රවේශපත්‍ර අන්තර්ජාලය මගින් නිකුත් කරනු ලැබේ. නියමිත කාලසීමාව තුළ එවැන්නක් බාගත කර ගැනීමට නොලැබුණහොත්, ඒ බව දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය වෙත දැනුම් දී අනතුරුව අනුපිටපතක් ලබා ගත හැකි ය.

## 6.2 විභාග පැවැත්වීමේ ක්‍රමවේදය

කැලණිය විශ්වවිද්‍යාලය තීරණය කරණ පරිදි විද්‍යාර්ථීන් විභාග ශාලාවලට කැඳවා හෝ මාර්ගගත ක්‍රමයට විභාග පැවත්වීම සිදු කරනු ලැබේ.

### 6.2.1 පාඨමාලා ඒකක ඇගයීම

සෑම පාඨමාලා ඒකකයක් ම ඇගයීමට ලක් කර ශ්‍රේණි ප්‍රදන කෙරේ. පාඨමාලා ඒකක ඇගයීම පහත සඳහන් ක්‍රමවලින් එකකට හෝ කිහිපයකට හෝ අනුව සිදුවිය හැකි ය.

ලිඛිත විභාග (Examination)
මූලාශ්‍රය පරිශීලන විභාග (Open Book Examination)
වාර්තා (Reports)
වාචික පරීක්ෂණ (Oral Test)
අඛණ්ඩ ඇගයීම් (Continuous Assessment)
පැවරුම් (Assignment)
මාර්ගගත ප්‍රශ්නාවලි (Online Quizzes)
පන්ති කාමර පරීක්ෂණ (In class Test)
ප්‍රස්තුතිකරණ (Presentation)
ආයතනික පුහුණුව (Internship/ Work-Based training)

### 6.2.2 පරීක්ෂණ

අපේක්ෂකයන්ගේ පහසුව සඳහා ඒ ඒ උපාධි පාඨමාලාවලට අදාළ පරීක්ෂණ වෙන් වශයෙන් පහත දැක් වේ.

**ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධිය (බාහිර)**

- ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි (බාහිර) ප්‍රථම පරීක්ෂණය
- ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි (බාහිර) දෙවන පරීක්ෂණය
- ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි (බාහිර) තෙවන පරීක්ෂණය

### 6.2.2.1 පැවරුම්

විෂය ඒකකයන් අයත් වන අධ්‍යයන අංශ විසින් අධ්‍යයන කටයුතු ඒ ඒ වසරවල දී ආරම්භ වන විට පැවරුම් ඉදිරිපත් කළ යුතු විෂය ඒකකයන් මොනවා ද යන්න ප්‍රකාශයට පත් කෙරේ.

- පැවරුම් සම්බන්ධ වැඩිදුර උපදෙස් හා විස්තර අන්තර්ජාලය හරහා අපගේ වෙබ් අඩවියෙන් ලබා ගත හැකි ය.

***නියමිත දිනට පසුව ලැබෙන පැවරුම් කිසිම හේතුවක් නිසා බාරගනු නොලැබේ.***

## 6.3. ප්‍රතිඵල නිර්ණය කිරීම

### 6.3.1 පරීක්ෂණ සාමාර්ථ්‍යය

**(අ).** බාහිර උපාධි පාඨමාලාවලට සම්බන්ධ පරීක්ෂණ සඳහා ඉදිරිපත් වන සෑම අපේක්ෂකයෙකු ම එක ම වතාවක දී අදාළ පරීක්ෂණ රෙගුලාසිවලට අනුකූල ව ඒ ඒ පරීක්ෂණවලට අදාළ ව තමන් පෙනී සිටි සියලු ම විෂයයන් හෝ පාඨමාලා ඒකකවලට අදාළ ශ්‍රේණි ලකුණු සාමාන්‍යයක් (GPA) ලබා සමත්වීමට සුදුසු මට්ටමක සිටින බව පරීක්ෂක මණ්ඩලය විසින් තීරණය කරනු ලැබුවහොත් එකී අපේක්ෂකයන් අදාළ පරීක්ෂණයෙන් සමත් වූ සේ සලකනු ලැබේ.

**(ආ).** කිසියම් පරීක්ෂණයකට අදාළ විෂයයකින්/පාඨමාලා ඒකකයකින් ඌන සාමර්ථ්‍යය/ප්‍රතිඌන සාමර්ථ්‍යය ලබා ඇති අපේක්ෂකයෙකු එකී ඌනතා සම්පූර්ණ කිරීමෙන් පසු ව පමණක් අදාළ පරීක්ෂණයෙන් සමත් වූ සේ සලකනු ලැබේ.

### 6.3.2. ඌන සාමාර්ථ්‍යය

කිසියම් පරීක්ෂණයක දී අදාළ නිර්ණායකවලට අනුව එම පරීක්ෂණවලින් සමත්වීම සඳහා අවශ්‍ය ශ්‍රේණි ලකුණු සාමාන්‍යය (GPA) ලබා නොගන්නා එහෙත් නිර්දේශිත විෂය ඒකක සංඛ්‍යාවකට පමණක් සාමර්ථ්‍යය සඳහා අදාළ ලකුණු සාමාන්‍යය ලබා ඇති අපේක්ෂකයන් අදාළ පරීක්ෂණවලින් ඌන සාමර්ථ්‍යය ලැබූ අය ලෙස සැලකේ.

### 6.3.3. අසමත්වීම

අදාළ පරීක්ෂණවලින් සමත් වීමට හෝ ඌන සාමර්ථ්‍යයක් ලැබීමට හෝ අදාළ අවශ්‍යතා සම්පූර්ණ නොකරන සියලු අපේක්ෂකයන් අදාළ පරීක්ෂණවලින් අසමත් වූ අය සේ සැලකේ.

### 6.3.4. ඌනතා සම්පූර්ණ කිරීම

අවසාන උපාධි පරීක්ෂණවලට ඉදිරිපත් වන සෑම අපේක්ෂකයෙකු ම ඊට ප්‍රථමයෙන් හෝ අවසාන පරීක්ෂණයට ඉදිරිපත් වන වර්ෂයේ ම හෝ තම උපාධි පාඨමාලාවට අදාළ පූර්ව පරීක්ෂණවල ඌනතාවන් ඇතොත් ඒ සියල්ල සම්පූර්ණ කර තිබීම අත්‍යවශ්‍ය වේ. තව ද, අවසාන උපාධි පරීක්ෂණයට පෙනී සිට සාමාන්‍ය/විශේෂ උපාධියක් නම්, අනතුරුව එළඹෙන වසර දෙක තුළ දී සිය ලියාපදිංචි කාලසීමාව අඛණ්ඩ ව පවත්වාගෙන යාමට යටත්ව හා පරීක්ෂණ රෙගුලාසිවලට අනුකූල ව තම උපාධි පාඨමාලාවට අදාළ ඌනතා සියල්ල සම්පූර්ණ කළ යුතු වේ. නියමිත කාලසීමාවන් තුළ අදාළ ඌනතා සම්පූර්ණ නොකරන කිසිම අපේක්ෂකයෙකු වෙත උපාධිය ප්‍රදානය කිරීම සඳහා කටයුතු කරනු නොලැබේ.

## 6.4 විභාග නීති රීති

### 6.4.1 විභාගයට පෙනී නොසිටීම

සෑම විද්‍යාර්ථියෙකු ම ලියාපදිංචි වන සියලු ම පාඨමාලා ඒකක සඳහා අනිවාර්යයෙන් ම විභාගයට පෙනී සිටිය යුතු ය. කිසියම් පාඨමාලා ඒකකයකට පෙනී නොසිටීම පිළිබඳ ව විශ්වවිද්‍යාලයීය අභියාචනා මණ්ඩලයට පිළිගත හැකි හේතුවක් ඉදිරිපත් නොකර, විභාගයට පෙනී නොසිටියහොත් අදාළ විභාගයට **නොපැමිණි** (ab) වශයෙන් සඳහන් කරනු ඇත.

### 6.4.2 අභියාචනා ඉදිරිපත් කිරීම

නොවැළැක්විය හැකි හේතුවක් නිසා ප්‍රථම වරට විභාගයට පෙනී සිටීමට නොහැකි වූ සිසුන්ට අභියාචනා ඉදිරිපත් කිරීම මගින් ප්‍රථම වරට පෙනී සිටින අපේක්ෂකයකු ලෙස අදාළ විභාගයට පෙනී සිටීමට අවස්ථාව ඇත. ඒ සඳහා අභියාචනා කමිටුවට පිළිගත හැකි හේතු පැහැදිලි කරමින් ලිපියක් ඉදිරිපත් කර එම කමිටුවෙහි නිර්දේශය ලබා ගත යුතු ය. අසමත් වූ විෂය ඒකක සඳහා මෙය වලංගු නොවේ.

### 6.4.3 අසමත් වූ විෂයයන් සඳහා නැවත පෙනී සිටීම

කිසියම් පාඨමාලා ඒකකයට C ශ්‍රේණියට පහළ අසමත් ශ්‍රේණි (C-/D+/D/E) ලබා ගත් විද්‍යාර්ථියෙකුට උපරිම වශයෙන් C ශ්‍රේණියක් ලබා ගැනීම සඳහා නැවත විභාගයට පෙනී සිටිය හැකි ය. මෙහි දී විද්‍යාර්ථියා ලබා ගත් ශ්‍රේණියට වඩා පහළ ශ්‍රේණියක් ලබා ගතහොත් කලින් තිබූ ශ්‍රේණිය ම උපාධියට ගණනය කරනු ලැබේ.

### 6.4.4 නැවත පෙනී සිටින සිසුන්ගේ පැවරුම් හා ප්‍රායෝගික පරීක්‍ෂණ

නැවත විභාගවලට පෙනී සිටින අපේක්‍ෂකයෙකු අදාළ ප්‍රශ්න පත්‍රයේ කොටසක් ලෙස පැවරුම් හෝ ප්‍රායෝගික පරීක්‍ෂණ සඳහා පෙනී සිටිය යුතු අවස්ථාවල දී නැවත ඒ සඳහා පැවැරුම් ඉදිරිපත් කිරීමට හෝ ප්‍රායෝගික පරීක්‍ෂණවලට පෙනී සිටීමට අවශ්‍ය නොවන අතර මුල් වතාවේ ලබා ඇති ලකුණු ඒ සඳහා අදාළ කර ගැනීමට හිමිකම් ලැබෙනු ඇත.

### 6.5. උපාධිය සම්පූර්ණ කිරීම සඳහා ලැබෙන කාලය

අඛණ්ඩ අධ්‍යයන වර්ෂ 5ක් ඇතුළත උපාධිය සම්පූර්ණ කළ යුතු අතර පන්ති සාමාර්ථ ලබා ගැනීමේ දී එය අඛණ්ඩ අධ්‍යයන වර්ෂ 3 ක් විය යුතු ය. එසේ වුව ද අධ්‍යයන වර්ෂ 10 ක උපරිමයකට යටත්ව අසමත් පාඨමාලා ඒකක සම්පූර්ණ කර ගැනීම සඳහා අභියාචනා ඉදිරිපත් කිරීමේ අවස්ථා ඇත.

### 6.5.1 ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධිය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධිය සම්පූර්ණ කිරීම සඳහා අපේක්ෂකයෙකු ලියාපදිංචි වී අවම වශයෙන් අධ්‍යයන වර්ෂ තුනක (03) කාලයක් ගත කළ යුතු ය. ලියාපදිංචි වී අධ්‍යයන වර්ෂයක් සම්පූර්ණ කළ පසු ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණයට පෙනී සිටීමට සුදුසුකම් ලබන අතර අනතුරුව එළඹෙන වර්ෂවල දී ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ද්විතීය හා තෘතීය පරීක්ෂණවලට පිළිවෙළින් පෙනී සිට උපාධිය සම්පූර්ණ කළ හැකි ය.

## 6.6 පරීක්ෂණ සඳහා පෙනී සිටීම

(අ). අදාළ අවශ්‍යතා සම්පූර්ණ කිරීමට යටත්ව ලියාපදිංචි සෑම අපේක්ෂකයෙකු ම ඒ ඒ උපාධි පාඨමාලාවලට අදාළ වර්ෂාවසාන පරීක්ෂණවලට පෙනී සිටිය යුතු ය.

(ආ). පිළිගත හැකි වෛද්‍ය හේතු මත අනුමැතිය දී ඇති අවස්ථාවල දී හැර සෑම අපේක්ෂකයෙකු ම තමා ලියාපදිංචි වූ සෑම විෂයයක් සඳහා ම එකවර පරීක්ෂණවලට පෙනීසිටිය යුතු ය.

(ඇ). පිළිගත හැකි වෛද්‍ය හේතු මත පරීක්ෂණයට ඉදිරිපත් වීමට හෝ පරීක්ෂණය සම්පූර්ණ කිරීමට හෝ අපොහොසත් වන අපේක්ෂකයෙකුහට පන්ති සාමාර්ථ්‍යයක් පිරිනැමීම සලකා බලනු ලබන්නේ අදාළ පරීක්ෂණය සඳහා නැවත ඉදිරිපත් වීමට ලැබෙන ප්‍රථම අවස්ථාවේ දී ම සම්පූර්ණ පරීක්ෂණයට එකවර පෙනී සිට ගෞරව සාමාර්ථ්‍යයක් ලැබීමට සුදුසු මට්ටමකින් පරීක්ෂණ රෙගුලාසිවලට අනුකූල ව එකී පරීක්ෂණයෙන් සමත් වී ඇති බව පරීක්ෂක මණ්ඩලය විසින් තීරණය කරනු ලබන්නේ නම් පමණි.

(ඈ). අනුමත වෛද්‍ය හේතුන් මත නැවත පරීක්‍ෂණවලට පෙනී සිටින අපේක්‍ෂකයන් ද නියමිත සම්පූර්ණ විභාග ගාස්තු ගෙවිය යුතු ය.

(ඉ). කිසියම් විෂයයකින්/විෂය ඒකකවලින්/පත්‍රවලින් අසමත් හෝ ඌන සාමර්ථ්‍යය හෝ ප්‍රතිඌන සාමාර්ථ්‍යය ලැබූ අපේක්ෂකයන් පරීක්ෂණ රෙගුලාසිවලට අනුකූල ව එකී පරීක්ෂණවලට නියමිත කාල වකවානු තුළ නැවත පෙනී සිට සිය ඌනතා සම්පූර්ණ කළ යුතු වේ.

## 6.7 අපේක්ෂකයන්ට උපදෙස්

(අ) විභාග අපේක්ෂකයෙකු පරීක්ෂණයට පෙනී සිටින සෑම අවස්ථාවක දී ම දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය මගින් නිකුත් කරන ලද ප්‍රවේශ පත්‍රය, ශිෂ්‍ය හැඳුනුම්පත හා ජාතික හැඳුනුම්පත තමන් සතුව තබාගත යුතු වේ. විභාග ශාලාවක දී ඉල්ලා සිටින ඕනෑ ම අවස්ථාවක දී සිය ශිෂ්‍ය හැඳුණුම්පත ඉදිරිපත් කිරීමට විභාග අපේක්ෂකයන් බැඳී සිටින අතර, එසේ නොකරන අවස්ථාවල දී සිය විභාග අපේක්ෂකත්වය පවා අවලංගු කිරීමට ඉඩ ඇති බව සියලු විභාග අපේක්ෂකයන් තේරුම්ගත යුතු ය. විභාගයට පෙනී සිටින අතරතුර සිය ශිෂ්‍ය හැඳුණුම්පත නැති වුව හොත් නොපමාව දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී දැනුවත්කොට අවශ්‍ය උපදෙස් ලබාගත යුතු ය.

(ආ) කිසියම් අපේක්ෂකයෙකු පරීක්ෂණයකට හෝ ඉන් කොටසකට හෝ පෙනී සිටිය නොහැකි වන සේ රෝගාතුර වුවහොත්, ඒ බව වහා ම දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය වෙත ලිඛිත ව දැනුම් දිය යුතු ය. රෝගාතුර වූ දින සිට ලිත් මසක් ඇතුළත ඒ සම්බන්ධයෙන් දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරියකුගෙන් හෝ රජයේ රෝහලක විශේෂඥ වෛද්‍යවරයෙකුගෙන් හෝ ලබාගත් වෛද්‍යසහතිකයක් ඉදිරිපත් කළ යුතු ය. මසක කාලය ඉකුත්වීමෙන් පසු ඉදිරිපත් කරන වෛද්‍ය සහතික ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ඇ) **අභියාචනා ඉදිරිපත් කිරීම**

නොවැළැක්විය හැකි හේතුවක් නිසා ප්‍රථම වරට විභාගයට පෙනි සිටීමට නොහැකි වූ සිසුන්ට අභියාචනා ඉදිරිපත් වීම මගින් ප්‍රථම වරට පෙනි සිටින අපේක්ෂකයකු ලෙස අදාළ විභාගයට පෙනී සිටීමට අවස්ථාව ඇත. ඒ සඳහා අභියාචනා කමිටුවට පිළිගත හැකි හේතු පැහැදිලි කරමින් ලිපියක් ඉදිරිපත් කර එම කමිටුවේ නිර්දේශ ලබා ගත යුතු ය. අසමත් වූ විෂය ඒකක සඳහා මෙය වලංගු නොවේ.

(ඈ) **අසමත් වූ විෂයයන් සඳහා නැවත පෙනී සිටීම**

කිසියම් පාඨමාලා ඒකකයට C ශ්‍රේණියට පහළ අසමත් ශ්‍රේණි ( C-/ D+/D/E) ලබාගත් විද්‍යාර්ථියකුට උපරිම වශයෙන් C ශ්‍රේණියක් ලබා ගැනීම සඳහා නැවත විභාගයට පෙනී සිටිය හැකි ය. මෙහි දී විද්‍යාර්ථියා ලබා ගත් ශ්‍රේණියට වඩා පහළ ශ්‍රේණියක් ලබා ගත හොත් කලින් තිබූ ශ්‍රේණිය ම උපාධියට ගණනය කරනු ලැබේ.

විභාග පිළිබඳ වැඩිදුර උපදෙස් විභාග අයදුම්පත්‍රය සමග අපේක්ෂකයන් වෙත නිකුත් කරනු ලැබේ.

## 6.8 විභාග අක්‍රමිකතා

- ❖ පරීක්ෂණ පැවැත්වෙන අවස්ථාවල දී සටහන්, ලිපිලේඛන, ජංගම දුරකතන ආදිය විභාග ශාලාවට රැගෙන ඒම හා ඒවා ළඟ තබා ගැනීම හෝ භාවිත කිරීම.

- ❖ විශ්වවිද්‍යාලය මගින් සපයනු ලබන ලිපිද්‍රව්‍ය හා ලේඛන ආදිය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම.

- ❖ කොපිකිරීම, කොපිකිරීමට උදවු කිරීම හෝ ඒ සඳහා අනුබල දීම.
- ❖ වෙනත් අයෙකු නමින් පරීක්ෂණවලට පෙනී සිටීම.

- ❖ අසංවර හැසිරීම හා වෙනත් ඕනෑ ම ආකාරයක වංචනික ක්‍රියා.

විභාග පැවැත්වෙන අවස්ථාවල දී අපේක්ෂකයන් විසින් සිදු කරනු ලබන අක්‍රමිකතා ඔප්පු වුවහොත්, පහත සඳහන් දඬුවම් එකක් හෝ කිහිපයක් නියම කිරීමට විශ්වවිද්‍යාල පනතේ විධිවිධානවලට අනුකූල ව කැලණිය විශ්වවිද්‍යාලයේ සනාතන සභාවට බලය පැවරී ඇත.

එසේ නියම කරනු ලැබිය හැකි දඬුවම් කිහිපයක් මෙසේ ය:

❖ විභාග අක්‍රමිකතා සඳහා දනට පනවා ඇති අවම දඬුවම වන්නේ වසර තුනක (03) කාලයක් දක්වා කිසිදු පරීක්ෂණයකට පෙනී සිටීම තහනම් කිරීමයි.

ඊට අමතර ව පහත සඳහන් දඬුවම්වලින් එකක් හෝ කිහිපයක් නියම කිරීමට ද සනාතන සභාවට බලතල ඇත.

❖ අදාළ පත්‍රය/විෂය ඒකකය සඳහා වූ අපේක්ෂකත්වය හෝ විභාග අපේක්ෂකත්වය සම්පූර්ණයෙන් අවලංගු කිරීම.

❖ ලියාපදිංචිය අත්හිටුවීම/අවලංගු කිරීම.

❖ දඩයක් සහිත ව හෝ රහිත ව කිසියම් කාල සීමාවකට විභාගයට පෙනී සිටීම තහනම් කිරීම.

❖ විශ්වවිද්‍යාල සනාතන සභාව නියම කරනු ලැබිය හැකි වෙනත් දඬුවමකට යටත් කිරීම.

## 7. විභාග ප්‍රතිඵල නිකුත් කිරීම

කැලණිය විශ්වවිද්‍යාලයේ සනාතන සභා අනුමැතියට යටත්ව කිසියම් පරීක්ෂණයක ප්‍රතිඵල නිකුත් කරනු ලැබූ වහාම අන්තර්ජාලය මගින් විභාග ප්‍රතිඵල ප්‍රකාශයට පත්කිරීම සඳහා කටයුතු කරනු ඇත.

### ❖ උපාධි පරීක්ෂණයේ අවසන් ප්‍රතිඵල නිකුත් කිරීම

උපාධි පරීක්ෂණයේ ප්‍රතිඵල නිකුත් කරනු ලබන්නේ අදාළ වර්ෂ තුන ඉකුත් වීමෙන් පසු සියලු ම වර්ෂවල (ස්තර තුනේ ම/හතරේ ම) ප්‍රතිඵල සලකා බලා අවසන් ප්‍රතිඵල ගණනය කොට විභාග ප්‍රතිඵල නිකුත් කිරීමේ කමිටුවේ අනුමැතිය ලැබීමෙන් අනතුරුව ය.

එක් එක් වර්ෂවල දී පැවැත්වෙන පරීක්ෂණවලට අදාළ සියලු පාඨමාලා ඒකකවලට අදාළ ප්‍රතිඵල නිකුත් වීමෙන් අනතුරුව විභාග ප්‍රතිඵල සටහනක් අන්තර්ජාලය ඔස්සේ දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ වෙබ් පිටුවේ ප්‍රදර්ශනය කරනු ඇත.

❖ **ශ්‍රේණි ලකුණු සාමාන්‍ය (GPA) සකස් කිරීම හා නිකුත් කිරීම**

එක් එක් වර්ෂවල දී පැවැත්වෙන පරීක්ෂණවලට අදාළ ව ශ්‍රේණි ලකුණු සාමාන්‍යය සකස් කිරීමක් සිදු නොවන අතර අදාළ වර්ෂ තුන ඉකුත් වීමෙන් පසු උපාධි පරීක්ෂණයේ අවසන් ප්‍රතිඵල ගණනය කිරීමේ දී පමණක් ශ්‍රේණි ලකුණු සාමාන්‍ය සකස් කොට ප්‍රතිඵල ලේඛනයේ සඳහන් කෙරේ. එබැවින් අවසන් ප්‍රතිඵල නිකුත් කිරීමට ප්‍රථම ශ්‍රේණි ලකුණු සාමාන්‍ය ලබා ගැනීමට විද්‍යාර්ථීන්ට හැකි යාවක් නැත.

### 7.1 විභාග ප්‍රතිඵල අත්හිටුවීම/තහනම් කිරීම

(අ) කිසියම් අපේක්ෂකයෙකු පිළිගත හැකි වෛද්‍යහේතු මත අදාළ පරීක්ෂණවල සියලු අවශ්‍යතා සම්පූර්ණ කර නොමැති අවස්ථාවල දී අදාළ අවශ්‍යතා සම්පූර්ණ කර ගන්නා තෙක් ඔහුගේ/ඇයගේ විභාග ප්‍රතිඵල නිකුත්කිරීම අත්හිටුවනු ලැබේ.

(ආ) කිසියම් අපේක්ෂකයෙකු විභාග අක්‍රමිකතා සඳහා දඬුවම් ලබා සිටින අවස්ථාවල දී ඔහුගේ/ඇයගේ විභාග ප්‍රතිඵල නිකුත් කිරීම තහනම් කරනු ලැබේ.

## 7.2 පිළිතුරු පත්‍ර නැවත සමීක්ෂණය කිරීම

**මොනම හේතුවක් නිසා හෝ උපාධි පාඨමාලාවලට අදාළ පිළිතුරුපත්‍ර නැවත සමීක්ෂණය සඳහා අවසර දෙනු නොලැබේ.**

## 08. ගාස්තු

විස්තර සහ අයදුම්පත් ගාස්තු රු. 1,000.00

### 8.1 පාඨමාලා ගාස්තු

ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි (බාහිර) පාඨමාලාව රු. 100,000.00

විද්‍යාර්ථීන්ගේ පහසුව සඳහා මෙම ගාස්තු වාරික මගින් ගෙවීමට අවස්ථාව සලසා ඇති අතර, එය පහත සඳහන් ආකාරයට දැක්විය හැකි ය.

**ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි (බාහිර) පාඨමාලාව**

අවුරුදු 03

| | |
|---|---|
| **පළමු වසර** | පළමුවන වාරිකය රු. 20,000.00<br>(ලියාපදිංචි වන අවස්ථාවේ දී ගෙවිය යුතු ය)<br><br>දෙවන වාරිකය රු. 25,000.00<br>(පළමු වසර විභාගයට පෙර ගෙවිය යුතු ය) |
| **දෙවන වසර** | තෙවන වාරිකය රු. 22,000.00<br>(පළමු වසර විභාගය අවසන් වී මාස දෙකකට පෙර ගෙවිය යුතු ය)<br>සිව්වන වාරිකය රු.18,000.00<br>(දෙවන වසර විභාගයට පෙර ගෙවිය යුතු ය) |
| **තෙවන වසර** | පස්වන වාරිකය රු. 15,000.00<br>(තෙවන වසර විභාගයට පෙර ගෙවිය යුතු ය) |

**සැ.යු.**

දැනට විශ්වවිද්‍යාලය වෙත ගෙවා ඇති මුදල් කිසිදු හේතුවක් මත ආපසු නොගෙවන අතර, එය පහත පරිදි අදාළ වනු ඇත.

✓ ඉහත ගාස්තුවලට අමතර ව එම විභාග සඳහා විශ්වවිද්‍යාලය විසින් නියම කරන ලබන විභාග ගාස්තුවක් ගෙවිය යුතු ය.

**අමතර ගාස්තු**

| | |
|---|---|
| ලියාපදිංචිය දීර්ඝ කිරීම (එක් වර්ෂයක් සඳහා) | රු. 1,500.00 |
| ශිෂ්‍ය හැඳුනුම්පත (නැවත සකස් කිරීම සඳහා) | රු. 500.00 |
| සපයා ඇති තොරතුරු වෙනස් කිරීම සඳහා | රු. 200.00 |
| සහතිකපත්‍ර ගාස්තු | රු. 1,000.00 |
| සහතිකපත්‍ර ගාස්තු (අමතර පිටපතක් සඳහා) | රු. 1,000.00 |

උපාධි ප්‍රදානෝත්සව ගාස්තු - (මුල් උපාධි සහතිකපත්‍ර ගාස්තු ඇතුළත් ව)

| | |
|---|---|
| උපස්ථිතියෙහි | රු. 6,000.00 |
| අනුපස්ථිතියෙහි | රු. 3,000.00 |

### 8.1.1 පරීක්ෂණ සඳහා අදාළ පැවරුම් ගාස්තු

ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි (බාහිර) පරීක්ෂණවලට අදාළ ඇතැම් පාඨමාලා ඒකක සඳහා පරීක්ෂණ අවශ්‍යතා ලෙස පැවරුම් ලබාදීමට දැනට අධ්‍යයන අංශ කිහිපයක් විසින් කටයුතු යොදා ඇත. එම අවශ්‍ය උපදෙස් විභාග අපේක්ෂකයන්ට සපයනු ලැබේ.

අදාළ පැවරුම් ලබා දිය යුතු අවසන් දිනයන් සම්මන්ත්‍රණවල දී දැනුම් දෙනු ලැබේ. එක් පැවරුමක් සඳහා රු. 300/- ක පරීක්ෂණ ගාස්තුවක් ගෙවිය යුතු අතර, එම ගාස්තුව ගෙවිය යුත්තේ නැවතත් විභාගවලට පෙනී සිටින සිසුන් පමණි. මෙම ගාස්තුව පළමු වර පෙනී සිටින සිසුන් ගෙවිය යුතු නැත.

## 9. අයදුම්පත් කැඳවීම

බාහිර උපාධි පාඨමාලාවලට ලියාපදිංචි වීමට සහ පරීක්ෂණ සඳහා පෙනී සිටීම පිණිස අයදුම්පත් කැඳවීම පුවත්පත් දැන්වීම් මගින් සහ අන්තර්ජාලය මගින් සිදුකරනු ලැබේ. ලියාපදිංචි වීම සහ පරීක්ෂණ සඳහා අයදුම්කිරීමේ දී ඒ සඳහා කැලණිය විශ්වවිද්‍යාලයේ දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ වෙබ් අඩවිය මගින් Online ක්‍රමයට පමණක් සිදු කරනු ලැබේ. අදාළ අයදුම්පත් නියමිත කාල සීමාවේ දී ලබා ගැනීමට කටයුතු කිරීම අයදුම්කරුවන්ගේ වගකීම වේ.

### 9.1. සම්පූර්ණ කරන ලද අයදුම්පත් කැඳවීම

නියමිත පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් අදාළ ලිපි ලේඛන සමගින් අයදුම්පත බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන උපාධිය/කාරණය පැහැදිලි ව සඳහන් කොට පහත දැක්වෙන ලිපිනයට එවිය යුතු ය.

**ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී**
**දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය**
**නො. 56/6**
**කෝන්ගහවත්ත පාර**
**නුවර පාර,**
**කිරිබත්ගොඩ**

## 10. අධ්‍යයන කටයුතු සඳහා පහසුකම් සැලසීම

### 10.1 අත්පත්‍රිකා/මාර්ගෝපදේශ ග්‍රන්ථ

බාහිර උපාධි පාඨමාලා සඳහා ලියාපදිංචි වන අපේක්ෂකයන් සඳහා උපරිම පහසුකම් සලසා දීමට කැලණිය විශ්වවිද්‍යාලයේ දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය මගින් නිරන්තරයෙන් ම කටයුතු කරනු ලැබේ. ඒ අනුව සිය අධ්‍යයන කටයුතු ඵලදායී ලෙස පවත්වාගෙන

යාම සඳහා මෙන් ම අදාළ අධ්‍යයන කටයුතු පවත්වාගෙන යාමේ දී ඇතිවන ප්‍රායෝගික දුෂ්කරතා සම්බන්ධව ද විශ්වවිද්‍යාල මහාචාර්ය, ආචාර්ය භවතුන්ගේ උපදෙස් ලබාගැනීමේ අවස්ථාව සලසා දීමේ හැකියාව කෙරෙහි අවධානය යොමු වී ඇත. මීට අමතර ව අදාළ පරීක්ෂණ සඳහා විවිධ විෂයයන්ට සහ පාඨමාලාවලට අදාළ LMS & Zoom දේශන සහ සම්මන්ත්‍රණ ද ඉතා වැදගත් වේ. විස්තර පත්‍රිකා, සටහන්, අත්පොත් ආදිය සැපයීම කෙරෙහි ද දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයෙහි අවධානය යොමු වී ඇත.

### 10.2 උපාධි පරීක්ෂණ සඳහා සම්මන්ත්‍රණ

සියලු ම උපාධි පරීක්ෂණවලට අදාළ ව සම්මන්ත්‍රණ පැවැත්වීම සඳහා බාහිර විභාග අංශය මගින් සියලු විධිවිධාන යොදනු ඇත. අදාළ සම්මන්ත්‍රණ දිනට සිංහල මාධ්‍යයෙන් පමණක් පැවැත්වෙන අතර, ඒ සඳහා වෙන ම ගාස්තුවක් ලියාපදිංචි වන අවස්ථාවේ දී හෝ ලියාපදිංචිය දීර්ඝ කරන අවස්ථාවේ දී හෝ අයකරනු ලැබේ. එක් එක් පරීක්ෂණවලට අදාළ සම්මන්ත්‍රණ සඳහා වෙන වෙන ම ගාස්තු ගෙවිය යුතු වේ. නියමිත ගාස්තු ගෙවා නැති කිසිදු අපේක්ෂකයෙකු වෙත සම්මන්ත්‍රණ/විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු නොලැබේ.

### 10.3 ඉගෙනුම් කළමනාකරණ ක්‍රමවේදය ( LMS)

උක්ත පහසුකම භාවිත කිරීම සඳහා අවශ්‍යවන පරිශීලක නාමය (Username) සහ අගුල් පදය (Password) කේන්ද්‍රය විසින් සිසුන් වෙත ලබා දීමට කටයුතු කරනු ලැබේ. මෙය වෙනත් පාර්ශ්වයන් වෙත පැවරීම දඬුවම් ලැබිය හැකි වරදක් වේ.

### 10.4 පසුගිය ප්‍රශ්නපත්‍ර

කැලණිය විශ්වවිද්‍යාලයේ දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය මගින් පෙර වර්ෂවල පවත්වන ලද පරීක්ෂණවලට අදාළ ප්‍රශ්නපත්‍ර අපගේ වෙබ් අඩවිය මගින් බාගත (Download) කර ගත හැකි ය.

එමෙන් ම පසුගිය විභාග ප්‍රශ්නපත්‍ර සහ පාඩම් මාලා LMS (Learning Management System) මගින් ලබා ගැනීමේ හැකි යාව පවතී.

## 11. සහතික පත්‍ර නිකුත් කිරීම

### 11.1 සහතික නිකුත් කිරීම

ලියාපදිංචි වීමෙන් පසු ප්‍රථම/දෙවන/තෙවන වසර තුළ දී විද්‍යාර්ථීන්ට අත්‍යවශ්‍ය කාරණයකට ඉල්ලීමක් කළ පසු අධ්‍යයන වාර්තාවක් (Partial Grade Report) මුදල් ගෙවා ලබා ගත හැක. අවසන් ප්‍රතිඵල නිකුත් කොට සනාතන සභාවේ අනුමැතියෙන් පසු ලබා දෙන විස්තර සහිත අධ්‍යයන සහතිකය (Academic Record) උපාධිය සමත් වන සෑම විද්‍යාර්ථියෙකු සඳහා ම ආයතනය මගින් නිකුත් කරන අතර එහි අතිරේක සහතිකය අවශ්‍ය නම් මුදල් ගෙවා ලබා ගත යුතු ය. උසස් අධ්‍යාපන ආයතන සඳහා අවශ්‍යතාව මත ලබා දෙන ලකුණු විස්තර සහිත රහස්‍ය අධ්‍යයන වාර්තාව (Academic Transcript) එම ආයතනයේ ලිපිය සමග විද්‍යාර්ථීන් විසින් ඉල්ලුම් කොට මුදල් ගෙවූ පසු එම ආයතනයට ලැබීමට සලස්වනු ඇත.

### 11.2 උපාධි සහතික නිකුත් කිරීම

උපාධි ප්‍රදානෝත්සවයෙන් අනතුරු ව නියම කර ගන්නා දිනයන් හි කැලණි විශ්වවිද්‍යාලය මගින් උපාධි සහතික නිකුත් කරනු ලැබේ.

### 11.3. උපාධි සහතික

උපාධි පරීක්ෂණයක ප්‍රතිඵල කැලණිය විශ්වවිද්‍යාලයේ සනාතන සභාව සහ පාලක සභාව විසින් අනුමත කරනු ලැබූ පසුව උපාධි ප්‍රදානෝත්සවයේ දී අදාළ උපාධි සහතික උපාධිධාරීන් වෙත නිකුත් කිරීම සඳහා කටයුතු කරනු ලැබේ.

### 11.4. උපාධි ප්‍රදානෝත්සවය

නියමිත උපාධි පාඨමාලා සාර්ථක ලෙස අවසන් කර ඇති සියලු ම උපාධිලාභීන් වෙත කැලණිය විශ්වවිද්‍යාලයීය උපාධි ප්‍රදානෝත්සවයක දී අදාළ උපාධි පිරිනැමීම සඳහා දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය විසින් සියලු විධි විධාන යොදා ඇත.

### 11.5 ස්වර්ණ මුද්‍රිකා ප්‍රදානය

කැලණිය විශ්වවිද්‍යාලයේ බාහිර උපාධි පාඨමාලා සාර්ථක ලෙස සහ අදාළ නිර්ණායකවලට යටත්ව සම්පූර්ණ කරන උපාධිලාභීන් වෙත සනාතන සභාවේ අනුමැතිය පරිදි මතු සඳහන් ස්වර්ණ මුද්‍රිකා ප්‍රදානය කිරීමේ වැඩ පිළිවෙළක් දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය විසින් ක්‍රියාත්මක කොට ඇත. ඒ ඒ වර්ෂවල උපාධි ප්‍රදානෝත්සව අවස්ථාවන්හි දී මෙම ස්වර්ණ මුද්‍රිකා ප්‍රදානය කරනු ලැබේ.

- කැලණිය විශ්වවිද්‍යාලයේ උපකුලපති ස්වර්ණ මුද්‍රිකාව
- කැලණිය විශ්වවිද්‍යාලයේ මානවශාස්ත්‍ර පීඨාධිපති ස්වර්ණ මුද්‍රිකාව

## 12 වෙනත් කරුණු

සියලු ම බාහිර උපාධි අපේක්ෂකයන් දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයෙන් කරනු ලබන සියලු විමසීම්වල දී පහත සඳහන් ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතු බවට උපදෙස් දෙනු ලැබේ.

### 12.1 පැමිණ විමසීම්

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය වෙත පැමිණ ඔබට අදාළ පාඨමාලාව සම්බන්ධ තොරතුරු විමසීම් සඳහා සතියේ **බදාදා** සහ **සිකුරාදා** යන දිනයන්හි පෙ.ව.10.00 සිට 12.00 දක්වාත් ප.ව. 1.30 සිට 3.00 දක්වාත් කාලය වෙන්කර ඇත.

### 12.2 දුරකතන විමසීම්

බාහිර විභාග අංශයෙන් ඔබට අවශ්‍ය තොරතුරු දුරකතනය මගින් විමසීම් සඳහා ද සතියේ දිනවල පෙ.ව. 9.00 සිට 3.00 දක්වාත් කාලය වෙන් කර ඇත.



011 2987000

011 2987001

011 2987002

011 2987005

### 12.3 ලිඛිත විමසීම්

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයෙන් ඔබට අදාළ බාහිර උපාධි පාඨමාලා සම්බන්ධ ව හෝ අදාළ පරීක්ෂණ සම්බන්ධ ව ලිඛිත ව කරුණු විමසීමේ දී මෙහි පහත දැක්වෙන ආකෘති පත්‍රයට අනුව සකස් කරන ලද ලිපියකින් අදාළ විමසීම් කළ යුතු අතර, එවැනි විමසීම් සඳහා පිළිතුරු එවීම පිණිස නියමිත වටිනාකමින් යුත් මුද්දර ඇලවූ ලියුම් කවරයක් ද එවිය යුතු ය. ලිඛිත විමසීම් එවනු ලබන ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ අදාළ කාරණය ඉතා පැහැදිලි ව සටහන් කළ යුතු වේ.

**දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයෙන් කරනු ලබන ලිඛිත විමසීමක් සඳහා ආදර්ශ ආකෘතිපත්‍රය**

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
නො. 56/6
කෝන්ගහවත්ත පාර
නුවර පාර
කිරිබත්ගොඩ

1. නම :- ..........................................................................................................
2. ලිපිනය :- ......................................................................................................
2. ශිෂ්‍ය අංකය :- ..............................................................................................
3. විභාග අංකය :- .............................................................................................
4. කාරණය :- ....................................................................................................
(ඉතා කෙටියෙන් සඳහන් කරන්න.)
5. අමුණා ඇති ලේඛනඃ- ....................................................................................
දිනය :- ..................................
ශිෂ්‍යයාගේ දුරකතන අංකය :- ......................................................
ශිෂ්‍යයාගේ අත්සන :- ............................................

**යෝජනා සහ පැමිණිලි**

ඔබගේ අදහස්, යෝජනා සහ පැමිණිලි ඇත්නම් ඒ සියල්ල පහත සඳහන් ලිපිනයට යොමු කරන්න.

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී,
දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය,
නො. 56/6,
කෝන්ගහවත්ත පාර,නුවර පාර,
කිරිබත්ගොඩ.

E-mail:- **cdce@kln.ac.lk**
Web site :-***www.cdce.kln.ac.lk***

## 13. බාහිර උපාධි අපේක්ෂකයන්ගේ විශේෂ අවධානය පිණිසයි

- බාහිර උපාධි පාඨමාලාවලට අදාළ ව පෞද්ගලික උපකාරක පන්ති/ආයතනවල ඉගැන්වීම් කටයුතු කරන කිසිදු ආචාර්යවරයකු ප්‍රශ්නපත්‍ර සකස් කිරීමේ හෝ පිළිතුරු පත්‍ර පරීක්ෂා කිරීමේ හෝ කිසිදු පරීක්ෂණ කටයුත්තක් සඳහා සහභාගී කරගනු නොලැබේ.

- බාහිර උපාධි පාඨමාලා සඳහා පෞද්ගලික උපකාරක පංති පැවැත්වෙන කිසිදු ආයතනයකට කැලණිය විශ්වවිද්‍යාලයීය දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය යටතේ ලියාපදිංචි ආයතනයක් වශයෙන් හෝ අනුබද්ධ ආයතනයක් වශයෙන් හෝ කටයුතු කිරීමට අයිතියක් ලබා දී නොමැත.

සියලු ම බාහිර උපාධි අපේක්ෂකයන් මෙම ශිෂ්‍ය අත්පොතෙහි සඳහන් කරුණු හොඳින් කියවා තේරුම් ගත යුතු අතර අදාළ උපාධි පාඨමාලාව හදාරා අවසන් වන තුරු මෙම අත්පොත සුරැකිව තබා ගන්නා ලෙස ද උපදෙස් දෙනු ලැබේ.

**මෙම අත්පොතෙහි සඳහන් ඕනෑ ම කරුණක් පූර්ව දැනුම් දීමකින් තොරව සංශෝධනය කිරීමේ සම්පූර්ණ අයිතිය කැලණිය විශ්වවිද්‍යාලය සතු වේ.**

**කැලණිය විශ්වවිද්‍යාලයීය දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ ප්‍රකාශනයකි.**